# උක් පර්යේෂණ ආයතනය


## ප්‍රධාන මධ්‍යස්ථානය - උඩවලව

දුරකථන: +94472233381, +94472233285

ෆැක්ස්: +9447223323

ඊ මේල්: info@sugarres. lk

වෙබ් අඩවිය: www. sugarres. lk

## උප කාර්යාලය

තෙලවල පාර, රත්මලාන

දුරකථන: +94112605759

ෆැක්ස්: +94112605236

## සභාපති

දුරකථන: +94112605759

ෆැක්ස්: +94112605145

## අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක

දුරකථන: +94472233282

ගරු සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා
සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
සී කොටස, 11 වෙනි මහළ,
සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

**2012.01.01 සිට 2012.12.31 දක්වා කාලය සඳහා**
**උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව**

2012.01.01 සිට 2012.12.31 දක්වා කාලය සඳහා උක් පර්යේෂණ ආයතනයේ ප්‍රගතියද, එම මුදල් වර්ෂය වෙනුවෙන් වූ අවසන් ගිණුම් හා විගණකාධිපතිගේ වාර්තාව, ඊට පිළිතුරු ද අඩංගු කොට ඉහත වාර්ෂික වාර්තාව සමග ඉදිරිපත් කරමි.

මෙයට,
විශ්වාසී,



සභාපති
උක් පර්යේෂණ ආයතනීය පාලක මණ්ඩලය.
2013.12.31

## පටුන


| | පිටුව |
|---|---|
| දැක්ම | 1 |
| මෙහෙවර | 1 |
| අරමුණු හා ඉදිරි යොමුව | 1 |
| පාලක මණ්ඩලය | 2 |
| සභාපතිගේ සමාලෝචනය | 3 |
| අධ්‍යක්ෂකගේ වාර්තාව | 7 |
| ආංශික වාර්තාව | 10 |
| බෝග වැඩිදියුණු කිරීමේ අංශය | 10 |
| බෝග හා සම්පත් කළමනාකරණ අංශය | 11 |
| බෝග පෝෂණ අංශය | 13 |
| බෝග ආරක්ෂණ අංශය | 14 |
| යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය | 16 |
| සැකසුම් තාක්ෂණ අංශය | 18 |
| ආර්ථික විද්‍යා, ජීවමිතික හා තොරතුරු තාක්ෂණ අංශය | 18 |
| තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන අංශය | 20 |
| පාලන හා ගිණුම් අංශය | 23 |
| ප්‍රකාශන | 31 |
| විගණනය කළ මූල්‍ය ප්‍රකාශන | 34 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 34 |
| මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනය | 35 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 36 |
| මූල්‍යම තත්ත්ව ප්‍රකාශනයට අදාළ සටහන් | 37 |
| මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනයට ආදාළ සටහන් | 41 |
| උප ලේඛණ: දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ | 44 |
| විගණකාධිපති වාර්තාව | 45 |
| විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 67 |
| වර්ෂ 2008 සිට 2012 දක්වා ප්‍රධාන මූල්‍ය තොරතුරු | 75 |

## දැක්ම

ශ්‍රී ලංකාවේ සීනි පිළිබඳ තාක්ෂණයන්හි
විශිෂ්ටතම මධ්‍යස්ථානය වීම

## මෙහෙවර

උක් පිළිබඳ යෝග්‍ය තාක්ෂණයන් නිපදවීම සහ ප්‍රචාරණතුළින්
ලංකා සීනි කර්මාන්තයෙහි නිශ්පාදනතාවය
ලාභදායි බව සහ චිරස්ථායිතාව ඉහළ නැංවීම

## අරමුණු හා ඉදිරි යොමුව

උක් කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළ නැංවීම, නිශ්පාදන පිරිවැය අඩුකිරීම, නිපදවන්නන්ගේ ආදායම ඉහළ නැංවීම සහ සීනි කර්මාන්තයේ අතුරුඵල භාවිතය ප්‍රවර්ධනය, ආයතනයේ අරමුණු සහ ඉදිරි දැක්මට අන්තර්ගත වේ.

# පාලක මණ්ඩලය

| | | |
|---|---|---|
| එස්. කේ. සිරිල් මයා | සභාපති | ගරු ඇමතිතුමා විසින් පත්කළ |
| ටී. එල්. ටී. ඒ. සුනිල් ද සිල්වා | සාමාජික | ගරු ඇමතිතුමා විසින් පත්කළ |
| පී. ආර්. පී. එල්. සී. විජේවර්නසූරිය | සාමාජික | ගරු ඇමතිතුමා විසින් පත්කළ |
| හසිත ගුණවර්ධන | සාමාජික | ගරු ඇමතිතුමා විසින් පත්කළ |
| පී. චාමිකා මධුවන්ති | සාමාජික | මුදල් අමාත්‍යංශය නියෝජනය කරමින් නම් කළ |
| ආර්. එම්. සී. එම්. හේරත් | සාමාජික | අතිරේක වැවිලි බෝග සංවර්ධන අමාත්‍යාංශය නියෝජනය කරමින් නම් කළ |
| ආචාර්ය එන්. සී. කුමාරසිංහ | සාමාජික | අධ්‍යක්ෂ (නිල බලයෙන් පත්වන) |

# සභාපතිගේ සමාලෝචනය

ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ද, මානව සම්පත් හා යටිතල පහසුකම් සංවර්ධන කටයුතුද, 2012-2016 සංයුක්ත සැළැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට 2012 වර්ෂය තුළදී ද හැකිවිය. උක් බෝග වැඩිදියුණු කිරීම, බෝග හා සම්පත් කළමනාකරණය, බෝග පෝෂණය, බෝග ආරක්ෂණ, ගොවිපොල යාන්ත්‍රීකරණය, නිශ්පාදිත හා නිශ්පාදන ක්‍රියාවලියේ සංවර්ධනය අන්තර්ගත උක් පර්යේෂණ ආයතනයේ දිගුකාලීන පර්යේෂණ වැඩසටහන උක් අස්වැන්න වැඩිකර ගැනීම සඳහාත්, සීනි නිස්සාරණය වැඩිකර ගැනීම සඳහාත්, උක් හා සීනි වල නිශ්පාදන වියදම අඩුකර ගැනීම සඳහාත්, උක් කර්මාන්තය හා සම්බන්ධ නිශ්පාදිතවල වටිනාකම වැඩිකර ගැනීම සඳහාත්, අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේදයන් පරිසරයට අවම හානියක් වන ආකාරයට සංවර්ධනයකර පවත්වා ගැනීමට අවශ්‍ය දැනුම උත්පාදනය කිරීම අරමුණු කර ක්‍රියාත්මක කිරීමට හැකිවිය. තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන  වැඩසටහන් මගින් මෙම නව තාක්ෂණික ක්‍රමවේදයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම දිරිමත් කළ අතර, එමගින් වඩාත් චිරස්ථායි ලෙස උක් පර්යේෂණ ආයතනයේ ඉදිරි සංවර්ධන කටයුතු පවත්වා ගැනීමට හැකිවනු ඇත.

මෙම වර්ෂය තුළ ආයතනය ලබාගත් කැපී පෙනෙන ප්‍රගතිය වනුයේ වැඩිදියුණු කරන ලද නව උක් ප්‍රභේද තුනක් වන එස්. එල්. 90 6237, එස්. එල්. 95 4443 හා එස්. එල්. 96 128 වානිජ වගාවන් සඳහා නිර්දේශකර නිදහස් කිරීමට හැකිවීමයි. මෙම නව උක් ප්‍රභේද ඉහළ උක් දඬු අස්වැන්නක් හා සීනි අස්වැන්නක් ලබා දෙන අතර වර්ෂාපෝෂිත හා ජලසම්පාදිත යන වගා ක්‍රම දෙකෙහිම වගා කිරීමට නිර්දේශිතයි. මින් එස්. එල්. 90 6237 වඩාත් ආන්තික පාංශු හා දේශගුණික තත්ත්ව යටතේ වුවද හොඳ අස්වැන්නක් අනුවර්තීතාවයක් දක්වනු ලබන අතර, උක් වගාවට වැළඳෙන කළු දුඹුළු රෝගයට මනා ප්‍රතිරෝධීතාවයක් හා ඉහළ නිරි වගා අස්වැන්නක් ලබාදීමට ඇති හැකියාවකුත් පෙන්නුම් කරයි. මෙම වැඩි දියුණු කරන ලද උක් ප්‍රභේද ගුණය සඳහා අවශ්‍ය අත්තිකාරම් බීජ නිශ්පාදනයත් එම බීජ මගින් මෙම වර්ග තව දුරටත් සීනි කර්මාන්ත ආයතන වගා බිම්වල ගුණනය කර වාණිජ වගාවන් සඳහා ගොවි මහතුන් අතර බෙදා හැරීමටත් අවශ්‍ය කටයුතු සම්පූර්ණ කිරීමට හැකි විය. වැඩි දියුණු කරන ලද මෙම නව උක් ප්‍රභේද වගා කිරීම නිසා අනාගතයේදී දේශීය උක් හා සීනි  අස්වනු වල සැළකිය යුතු වර්ධනයක් බලාපොරොත්තු විය හැකිය.

දැනට ලංකාවේ වාණිජ උක් වගා බිම්වල 42% ක  පමණ වපසරියක දේශීය පරිසර තත්ත්වයන්ට උචිතවන ආකාරයට උක් පර්යේෂණ ආයතනය මගින් අභිජනනය කර වැඩි දියුණු කරන ලද උක් ප්‍රභේද ව්‍යාප්තව ඇත. මෙම නව උක් ප්‍රභේද හඳුන්වාදීම නිසා දේශිය උක් දඬු අස්වැන්නෙහි හෝ සීනි අස්වැන්නෙහි සැළකිය යුතු වර්ධනයක් මෙතෙක් දක්නට නොලැබුනත්, 90 දශකයේදී උක් වගාවට වැළඳුන විනාශකාරී සුදු පත්‍ර රෝගයෙන් හා 2006 වර්ෂයෙන් පසුව උක් වගාවන්ට ව්‍යසනයක්ව පැවති වූල් කුඩිත්තා කෘමි හානියෙන් දේශීය උක් කර්මාන්තය ආරක්ෂාකර ගැනීමට මෙම නව උක් ප්‍රභේද මහඟු පිටුවහලක් විය.

මෙම ව්‍යවසනකාරී රෝගී තත්වයන් හා කෘමි හානි පැතුරුණු අවස්ථාවන්හි දී දේශීයව අභිජනනය කරන ලද නව උක් ප්‍රභේද නොතිබුනි නම් වානිජ උක් වගාවන් සම්පූර්ණයෙන්ම විනාශ වීමටත්, එමගින් සීනි කර්මාන්තශාලා වලට හා උක් ගොවි මහතුන්ට තදබල වශයෙන් පාඩු හා අපහසුතාවයන්ට පත්වීමට ඉඩ තිබුණි. උක් පර්යේෂණ ආයතනය මගින් හඳුන්වාදෙන ලද එස්. එල්. 8306 උක් ප්‍රභේදය ඉහත දක්වන ලද සුදු පත්‍ර රෝගය හා වූල් කුඩිත්තා කෘමි හානියට දක්වන ලද ඔරොත්තුදීමේ හැකියාව නිසා මෙම අවස්ථාවලදී දේශීය උක් කර්මාන්තය බිඳවැටීමට තිබූ අවදානම පාලනය කිරීමට හැකිවිය. එසේම ඉහත අස්වැන්න සැළකිය යුතු මට්ටමකින් අඩුවීමටත් එමගින් සීනි කර්මාන්තශාලා හා උක් ගොවි මහතුන්ගේ ආදායම සැළකියයුතු මට්ටමකින් අඩුවීමටත් ඉඩ තිබුණි

මීට අමතරව සෙවනගල ප්‍රදේශයෙන් ලබා ගත හැකි උක් අස්වැන්න, පාංශු හා බෝගයේ අවශ්‍යතාවය පසෙහි

ඇති පෝෂක ප්‍රමාණය යන කරුණු සැළකිල්ලට ගෙන සෙවනගල උක් වගා ඉඩම් සඳහා පොහොර නිර්දේශයන් ලබාදීමට හැකි විය. මෙම නිර්දේශිත පොහොර මිශ්‍රණය යෙදීම මඟින් අනාගතයේදී එම ප්‍රදේශයේ උක් දඬු අස්වැන්න හා සීනි අස්වැන්න වැඩිවීමත් සීනි නිස්සාරණය වැඩිවීමත්,පාංශු සශ්‍රීක බව පවත්වා ගැනීමට හැකිවීමත්, පරිසර දූෂණය අවම කිරීමට හැකි වීමත් කරගත හැකිය. එසේම පාංශු සශ්‍රීක බව පවත්වා ගැනීම පිළිබඳ දැනුම වර්ධනය සඳහා පුහුණු සැසි පවත්වන ලදී උක් වගාවට ව්‍යසනයක්ව පැවති වූල් කුඩිත්තා කෘමි පළිබෝධ හානිය පාලනය සඳහා වානිජ උක් වගාවල කෘමි පළිබෝධ තත්වයන් නිරන්තර පරීක්ෂාවට ලක් කිරීමත්, මෙම පළිබෝධකයාගේ ස්වභාවික සතුරන් වන ඩයිෆා එපිඩිවෝරා හා මයික්‍රොමස් විශේෂ ගුණනය කර වානිජ වගා බිම්වලට නිදහස් කිරීමත්, මෙම ස්වභාවික සතුරන් ආරක්ෂාකර ගැනීම පිළිබඳ ගොවි මහතුන් හා සීනි කර්මාන්ත ආයතන නිළධාරීන් දැනුවත් කිරීමත් මගින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනිමට හැකිවිය. උක් වගාවේ වූල් කුඩිත්තා කෘමි උවදුර පාලනය සඳහා ස්වභාවික පාලන ක්‍රම යොදා ගැනීම වඩාත් පරිසර හිතකාමී වන අතර උක් ගොවි මහතුන්ට හෝ සීනි කර්මාන්තශාලා වලට මේ සඳහා අමතර වියදමක් දැරීමට සිදු නොවේ.මීට අමතරව උක් වගාවල රෝග හා පළිබෝධ නිරන්තර පරීක්ෂාවට ලක් කිරීමටත්‌ වගාවක රෝග හා පළිබෝධ

රෝද දෙකේ ට්‍රැක්ටරය මගින් ක්‍රියාකරවිය හැකි හා එය ගමන් කරන වේගය අනුව ස්වයංක්‍රීයව පොහොර පතිතවීම පාලනය කරනු ලබන අතර අඩු වියදම් හා පහසුවෙන් ක්‍රියා කරවිය හැකි පොහොර යොදනය නිපදවීම සාර්ථකව සම්පූර්ණ කිරීමට මෙම වර්ෂය තුල හැකි විය. එසේම උක් පර්යේෂණායතනය මගින් හඳුන්වාදෙන ලද ටයින් නගුල් හා ඇලි හා වැටි සාදන කිහිපයක් ආයතනයේ යාන්ත්‍රිකරණ වැඩපොල තුළ නිපදවා උක් ගොවි මහතුන් හා උක් ගොවි සංවිධාන අතර සහනදායි මිලකට බෙදා හැරීමටත් එමගින් මෙම ගොවි උපකරණ භාවිතය ඔවුන් අතර ප්‍රචලිත කිරීමටත් අවශ්‍ය කටයුතු කරන ලදී

උක් බෝගයේ අතුරු බෝග ලෙස කවුපි, මුං ඇට, රටකජු, පිපිඤ්ඤා හා පැණී කොමඩු වැනි බෝග වගා කිරීමට ගොවිමහතුන් දිරිමත් කළ අතර එමගින් ඔවුනට අමතර ආදායමක් ලබා ගැනීමට හැකිවිය. බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර ප්‍රදේශයේ ක්‍රියාත්මක උක් හකුරු නිශ්පාදන කර්මාන්තය නගා සිටුවීම සඳහා එම ප්‍රදේශයට නව උක් ප්‍රභේද හඳුන්වාදීමත්, ප්‍රදේශයේ උක් වගා වපසරිය වැඩි කිරීමට උපකාර කිරීමත්, ගොවි මහතුන්ට මූල්‍යමය පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් හා ක්‍රමවේදයන් සලසාදීම හා සම්බන්ධීකරණය කිරීමත්, හකුරු කර්මාන්තශාලා හිමියන්ට ඉහළ ගුණාත්මයෙන් යුතු හකුරු නිපදවීම පිළිබඳ දැනුවත් කිරීමක් කරන ලදී

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ උක් වගා කිරීම හා ඒ ආශ්‍රිතව සුළු පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා යෝජිත නියමු ව්‍යාපෘතියට අදාල උක් වගා බිම් ගොනුව ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය බීජ උක් ගුණනය එම ප්‍රදේශයේ තෝරාගත් ගොවිමහතුන්ගේ ඉඩම් වල තව දුරටත් කරගෙන යන ලදි. මේ යටතේ 2012 මහ කන්නයේ ප්‍රදේශයේ ගොවි මහතුන් 23 දෙනෙකුට අයත් ඉඩම් හෙක්ටයාර 8 ක පමණ ප්‍රදේශයක මීට පෙර වර්ෂයේ ගොවිමහතුන් 07 දෙනෙකුට අයත් ඉඩම්වල ස්ථාපිත තවාන් වල ගුණනය කරන ලද බීජ උක් සිටුවන ලදී.ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු තරමක් දුරට පසුබෑමක් දක්නට ලැබුනත් මූලික සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස අනුගමනය කළයුතු ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී

එනසාල්වත්ත උක් අභිජනන උප මධ්‍යස්ථානයේ මූලික සංවර්ධන කටයුතු කරගෙන යන ලදි. උක් පර්යේෂණ ආයතනය මගින් නිපදවා, නිර්දේශ කර හඳුන්වා දෙන ලද නව වැඩි දියුණු කරන උක් ගොවි මහතුන් හා සීනි කර්මාන්තායතන වෙත ප්‍රචලිත කිරීම සඳහා තව දුරටත් ගුනනය කිරීමට අවශ්‍ය අත්තාකාරම් බීජ නිපදවීම සඳහා දැනට පවත්වාගෙන යන තවාන් බිම් වපසරියට අමතරව තවත් හෙක්ටයාර 05 ක භූමියක් සංවර්ධනය කර පිළිසකර කරන ලදි. ආයනයේ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය තනි කුටීර ද්විත්ව කාර්ය වාහන දෙකක් මිලදී ලත් අතර, ද්විත්ව කුටීර ද්විත්ව කාර්ය සඳහා වාහන දෙකක් හා රෝද හතරේ ට්‍රැක්ටර් දෙකක් මිලදී ගැනීම පිණිස අවශ්‍ය කටයුතු සම්පූර්ණ කරන ලදී

ආයතනයේ පුරප්පාඩුව පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂක (පර්යේෂණ හා තාක්ෂණ සම්ප්‍රේෂණ) තනතුර, පර්යේෂණ තනතුරු 06, තාක්ෂණ නිළධාරි තනතුරු 2, රියදුරන් තිදෙනෙක්, ට්‍රැක්ටර් ක්‍රියාකරුවන් දෙදෙනෙක්, යාන්ත්‍රික ශිල්පියෙක් සහ සාමාන්‍ය කම්කරුවන් 06 ක් බඳවා ගැනීමට හැකිවීම ආයතනීය මානව සම්පත් සංවර්ධන කටයුතුවලට අදලව මෙම වර්ෂය තුළ ඉටුකර ගැනීමට හැකිවූ වැදගත් කාර්යයකි. මීට අමතරව පර්යේෂණ නිළධාරීන් දෙදෙනෙකුට පශ්චාත් උපාධි අධ්‍යනය සඳහා විදේශ ශිෂ්‍යත්ව දෙකක් ලබා දීමට හැකි විය. ඉන් එක් ශිෂ්‍යත්වයක් විද්‍යාපති උපාධිය සඳහා සෝමාවල දකුණු පැසිපික් විශ්ව විද්‍යාලයටත් අනෙක් ශිෂ්‍යත්වය ආචාර්ය උපාධිය සඳහා ඉන්දියාවේ කර්නාටක ප්‍රාන්තයේ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාලයටත් ලබා දෙන ලදී

පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙක් හා එක් සංවර්ධන නිළධාරියෙකුහට ඉන්දියාවේ ලක්නවු වල ඉන්දීය උක් පර්යේෂණ ආයතනයෙහි උක් වගාව හා හකුරු නිපදවීම පිළිබඳ සති දෙකක දැනුවත් වීමේ වැඩ සටහනකට සහභාගි වීමට අවස්ථාව ලැබුණි.මීට අමතරව ආයතනයේ විවිධ මට්ටම් වල සේවයේ නියුතු නිළධාරීන් සඳහා තම දැනුම හා නිපුනත්වයන් නංවා ගැනීම පිණිස අදල පුහුණුවීම් සැසි ගණනාවකට සහභාගිවීමට අවස්ථාව ලබාදී ඇත. එසේම විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන හා ගිණුම්කරණයට සම්බන්ධ විවිධ තරාතිරම් වල නිළධාරීන්ගේ කුසලතා සංවර්ධනය සඳහා උපකාරීවන

සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු සැසි සඳහා සහභාගි වීමට ඔවුනට අවස්ථාව ලැබුණිසුළු අපනයන බෝග සංවර්ධන අමාත්‍යාංශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කජු සංස්ථාව හා උක් පර්යේෂණ ආයතනය එක්ව පවත්වන ලද කෘෂි අපනයන බෝග පිළිබඳව වාර්ෂික සම්මන්ත්‍රණය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය හා උක් පර්යේෂණ ආයතනය එක්ව පවත්වන ලද වැවිලි බෝග පර්යේෂණ පිළිබඳ සිවුවෙනි සම්මන්ත්‍රණය යන විද්‍යාත්මක සම්මන්ත්‍රණ දෙක සඳහා ආයතනය මඟින් පර්යේෂණ වාර්තාගණනාවක් ඉදිරිපත් කරන ලදී

එසේම මෙම වර්ෂය තුල උක් පර්යේෂණ ආයතනය ඉන්දියන් උක් පර්යේෂණ ආයතනයත්, පකිස්ථානයේ සකර්ජන් සීනි පර්යේෂණායතනය සහ පන්ජාබ් කෘෂිකර්මික පර්යේෂණ මණ්ඩලය සමඟ සමීප සම්බන්ධතා වැඩි දියුණු කරගැනීමට හැකි වූ අතර එමඟින් ආයතනයට අන්තර් සයයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්ම කිරීමටත්, පර්යේෂණ හා තාක්ෂණ නිලධාරින් සඳහා පුහුණුවීම් අවස්ථා ලබාගැනීමටත් අවස්ථාව ලැබුනි.



එස්. කේ. සිරිල්
සභාපති.

# අධ්‍යක්ෂකගේ වාර්තාව

උක් පර්යේෂණ ආයතනය ස්ථාපිත කර මේ වනවිට වර්ෂ 28 ක් ගත වී ඇති අතර දේශීය උක් කර්මාන්තය නංවාලීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම උත්පාදනය හා තාක්ෂණික ක්‍රම ගොවි මහතුන් අතර ව්‍යාප්ත කිරිම සඳහා කළයුතු කාර්යභාර්ය 2012 වර්ෂය තුළදී අඛණ්ඩව ද සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය. මේ සඳහා ක්‍රියාත්මක පර්යේෂණ වැඩ සටහන බෝග වැඩි දියුණු කිරීම, බෝග හා සම්පත් කළමනාකරණය, බෝග පෝෂණය, බෝග ආරක්ෂණය, ගොවිපල යාන්ත්‍රීකරණය, නිෂ්පාදන ක්‍රියාවලිය හා නිෂ්පාදිත සංවර්ධනය ඇතුලත් දිගු කාලීන වැඩ සටහනකි.

වැඩිදියුණු කරන ලද නව උක් ප්‍රභේද තුනක් වන එස්. එල් 90 2637, එස්. එල් 95 4443 හා එස්. එල් 96 128 නිර්දේශ කර වානිජ වගාව සඳහා නිදහස් කිරීමට හැකි වීම පර්යේෂණ වැඩ සටහනෙහි මේ වර්ෂය තුල දක්නට ලැබෙන කැපී පෙනෙන ප්‍රගතියකි. මෙම නව උක් ප්‍රභේද තුන නිර්දේශ කර නිදහස් කිරීමත් සමග උක් පර්යේෂණ ආයතනය මගින් මේ දක්වා වැඩි දියුණු කර වානිජ වගාව සඳහා ලබා දී ඇති උක් ප්‍රභේද සංඛ්‍යාව 15 දක්වා ඉහළ යනු ඇත. මෙම ප්‍රභේද අතුරින් එස්. එල් 90 6237 දුර්වල පාංශු හා දේශගුණික තත්වයක් පවතින වඩාත් රළු පාරිසරික තත්වයක වුවද වගා කිරීමට හැකි අනුවර්තීතාවයක් පෙන්නුම් කරනු ලබන අතර උක් වගාවට වැළඳෙන කළු දුඹුළු රෝගයට ඉහල ප්‍රතිරෝධීතාවයක් පෙන්නුම් කරනු ලබයි.

එසේම මෙය වර්ෂාපෝෂිත හා ජල සම්පාදිත යන වගා ක්‍රම දෙකෙහිදීම ඉහල නිරි වගා අස්වනු දෙන ප්‍රභේදයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම නව උක් ප්‍රභේද වගා කිරීම ප්‍රචලිත කිරීම සඳහා ගොවි මහතුන් හා සීනි කර්මාන්ත ආයතන නිළධාරින් දැනුවත් කිරීමට උපදේශක පත්‍රිකා පිළියෙල කිරීම සඳහා සහ බෙදා හැරීමත් එම වර්ග වගා කිරීමෙන් ලබා ගත හැකි වාසි ඒත්තු ගැනීම සඳහා ආදර්ශන පැවැත්වීමටත් ආයතනයේ තාක්ෂණ සම්ප්‍රේශණ හා සංවර්ධන අංශය කටයුතු කරන ලදි. එසේම මෙම නව උක් ප්‍රභේද ගුණනය කර බීජ උක් ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික අත්තිකාරම් බීජ උක් නිපදවීමට 2011 වර්ෂයේ හෙක්ටයාර 5.5ක පමණ වපසරියක අරඹණ ලද බීජ උක් තවාන 2012 වර්ෂයේ පවත්වාගෙන ගිය අතර මෙම වර්ෂය තුළ එහි වපසරිය තවත් හෙක්ටයාර 5 කින් වැඩි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලදි. මෙම අත්තිවාරම් බීජ උක් ටොන් 65 ක් පමණ සෙවනගල සීනි කර්මාන්ත ආයතනය වෙත තව දුරටත් ගුණනය කිරීම සඳහා ලබා දීමට හැකි විය.

බෝග හා සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ ප්‍රතිඵලයකට අනුව ග්ලිරිසිඩියා පත්‍ර සහ උක් රොඩු භාවිතා කර පැල වගාවන්වල අතුරනු යෙදීම මගින් සෙවනගල ප්‍රදේශයේ දැනට ඇති ආතතික උක් ඉඩම් සශ්‍රීක කරගත හැකි බව තහවුරු කරන ලදි. එසේම නිශ්චිත පරතරයක් ඇතිව පැල සිටුවීමේ තාක්ෂණ ක්‍රමය වානිජ උක් වගා ස්ථාපිත කිරීමේ ආර්ථික හා ලාභදායි ප්‍රගුණන ක්‍රමයක් ලෙස හඳුනාගන්නා ලදි. උක් කරටි භාවිතා කර පිළියෙල කර ගත් ආහාර සලාක සාර්ථකව කිරි ගවයින් හට ආහාර වශයෙන් ලබාදිය හැකි බව හඳුනාගෙන ඇති

බෝග පෝෂණ අංශය සෙවනගල ප්‍රදේශයේ ලබාගත හැකි උක් අස්වැන්නත්, පසෙහි අඩංගු පාංශු පෝශක ප්‍රමාණයත් උක් බෝගයෙන් පෝෂක ඉවත් කිරීමේ ප්‍රවනතාවයත් සැළකිල්ලට ගෙන එහි වර්ෂාපෝෂිත හා ජල සම්පාදිත යන වගා ක්‍රම දෙකෙහිදීම උක් වගා සඳහා යොදනු ලබන පොහොර නිර්දේශයන් යාවත්කාලීන කර නිර්දේශ ඉදිරිපත් කරන ලදි. එසේම මෙම නව පොහොර නිර්දේශ වගාවන් සඳහා යෙදීමටත්, එමගින් උක් හා සීනි අස්වැන්න වැඩි කර ගැනීමටත් අවශ්‍ය උපදෙස් සෙවනගල සීනි කර්මාන්ත ආයතනය වෙත ලබා දෙන ලදි.ආයතනයේ බෝග ආරක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම මගින් උක් වගා බිම්වල පැතුරුණු විනාශකාරී පළිබෝධ හානියක් සහ වූල් කුඩිත්තාගේ කෘමි හානියත් මාරාන්තික සුදු පත්‍ර රෝගයේත් පැතිරීම පාලනය

කිරීමට හැකි විය. එසේම ආයතනය මගින් වානිජ වගා වල රෝග හා පළිබෝධ පැතිරීම වර්ෂය පුරා නිරන්තර පරික්ෂාවට ලක් කිරීමත් ඒ අනුව පාලනය සඳහා අවශ්‍ය උපදෙස් ගොවි මහතුන් හා සීනි කර්මාන්ත ආයතන නිළධාරීන් වෙත නිරන්තරව ලබාදීමත් කරගෙන යන ලදි

මෙහිදී වුල් කුඩිත්තා පැතිරීම පාලනය සඳහා එම කෘමියාගේ විලෝපිකයින් හා ස්වභාවික සතුරන් ආරක්ෂාකර සංරක්ෂණය කිරීමට වැඩි අවධානයක් යොමු කරන ලදි. මීට අමතරව තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන අංශයත් බෝග ආරක්ෂණ අංශයත් එක්ව උක් වගාවේ රෝග හා පළිබෝධ හානි පිළිබඳ ගොවිමහතුන් හා සීනි කර්මාන්ත ආයතන නිළධාරීන් දැනුවත් කිරීම පිණිස පුහුණු සැසි ගනනාවක් පවත්වන ලදි

පර්යේෂණ නිළධාරීන්ගේ හිගය යාන්ත්‍රික තාක්ෂණික අංශයේ පර්යේෂණ කටයුතු වල ප්‍රගතියට සැළකිය යුතු බාධාවක් විය. වර්ෂයේ අවසාන භාගයේදී මෙම අංශයට බඳවා ගනු ලැබූ නවක පර්යේෂණ නිළධාරියාට මෙම වර්ෂය තුළ කළ හැකි වූයේ සීමිත වැඩ කොටසකි. යාන්ත්‍රික පොහොර යොදනයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදි. ටයින් කල්ටිවේටර නඟුල හා ඇලි සාදනය උක් වගා කටයුතු සඳහා යොදගැනීම ව්‍යාප්ත කරනු පිණිස ගොවි මහතුන් අතර බෙද හැරීම සඳහා ටයින නඟුල් 20 හා ඇලි සාදන 10 ක් ආයතනය තුළ නිපදවන ලදි. ටයින නඟුල් 9 ක් පැලවත්ත ප්‍රදේශයේ ගොවි මහතුන් අතර සහනදයි මිලකට ලබාදෙන ලදි. මීට අමතරව උක් හකුරු නිශ්පාදන ඒකකයෙහි උක් ඇඹරුම් යන්ත්‍රය, උඳුන් හා දුම් කවුළුව සම්පූර්ණයෙන් අළුත් වැඩියාකර කාර්යක්ෂමව වැඩ කිරීමට හැකි තත්වයට පත් කිරීමට හැකිවිය.

නව උක් ප්‍රභේද වගා කිරීම, ගොවිපොල යාන්ත්‍රීකරණය, උක් වගාවල රෝග හා පළිබෝධ මර්ධනය යන කටයුතු සඳහා පෙළඹවීම හැරුණුකොට නිශ්චිත පරතරයක් ඇතිව උක් දඬු සිටුවීමේ තාක්ෂණය, පාංශු සශ්‍රීකත්වය පවත්වා ගැනීම, අතුරු බෝග වගාව සහ අනෙකුත් බෝග පාලන කටයුතු පිළිබඳව ගොවි මහතුන් හා සිනි කර්මාන්තායතන නිළධාරීන් දැනුවත් කිරීම පිණිස පුහුණු සැසි හා ආදර්ශන රැසක් මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට හැකි විය. බුත්තල, සියඹලාණ්ඩුව, හිඟුරාණ, හා පස්සර යන ප්‍රදේශවට අනුයුක්ත කර ඇති සංවර්ධන නිළධාරීන් මගින් උක් පර්යේෂණ ආයතනය, සීනි කර්මාන්ත ආයතන, හා ගොවි මහතුන් අතර සමීප සම්බන්ධතාවයක් පවත්වාගැනීමට හැකි විය.

පස්සර ප්‍රදේශයේ ගෘහ ආශ්‍රිත කර්මාන්තයක් ලෙස හකුරු නිපදවීම වැඩි දියුණු කිරීමේ හා ප්‍රචලිත කිරීමේ කටයුතු වල සැළකියයුතු ප්‍රගතියක් මෙම වර්ෂය තුල ලබා ගැනීමට හැකි විය. උක් පර්යේෂණ ආයතනයේ නිශ්පාදිත නව උක් ප්‍රභේද මෙම ප්‍රදේශවල වගා කිරීම සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම්කළ අතර, ප්‍රදේශයේ බැංකු සමග සම්බන්ධීකරණය මගින් උක් වගා කිරීම සඳහා ගොවි මහතුනට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීමට හැකිවිය. පුහුණු සැසි හා ආදර්ශන පැවැත්වීම මගින් ගුණාත්මක හකුරු නිෂ්පාදනය පිළිබඳ ගොවි මහතුන් හා හකුරු නිපදවන්නන් දැනුවත් කිරීමට හැකියාව ලැබුණි.

කිලිනොච්චි ප්‍රදේශයේ උක් වගාව නැවත ස්ථාපිත කිරීම පිණිස ඇරඹි උක් වගා බිම් ස්ථාපිත කිරීම හා හකුරු නිෂ්පාදන ඒකකයක් ඇරඹීමේ නියමු ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය බීජ උක් ගුණන කටයුතු මෙම වර්ෂය තුළ කරගෙන යන ලදි. ප්‍රදේශයේ ගොවි මහතුන් 07 දෙනෙකු විසින් 2011 වර්ෂයේ වගා කරන ලද බීජ උක් 2012 වර්ෂයේ මහා කන්නයේදී ප්‍රදේශයේ ගොවි මහතුන් 23 දෙනෙකුට අයත් හෙක්ටයාර 08 ක පමණ වපසරියක තවදුරටත් ගුණනය කරන ලදි

ආයතනයේ මානව සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ සැළකිය යුතු වර්ධනයක් මෙම වර්ෂය තුළ දක්නට ලැබුණි. මේ අතරින් මෙතෙක් පුරප්පාඩුව පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂක ( පර්යේෂණ හා තාක්ෂණ සම්ප්‍රේෂණ), පර්යේෂණ නිළධාරීන්, තාක්ෂණික නිළධාරීන්, රියදුරන්, ට්‍රැක්ටර් ක්‍රියාකරුවන්, යාන්ත්‍රික ශිල්පීන්, සාමාන්‍ය කම්කරුවන් වැනි විවිධ තරාතිරම් වලට අයත් තනතුරු 23 පිරවීමට හැකි විය. පර්යේෂණ නිළධාරීන් දෙදෙනෙක් පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා විදේශ විශ්ව විද්‍යාලය වෙත යැවීමට හැකි විය. පර්යේෂණ නිළධාරීන් දෙදෙනෙක් සහ එක් සංවර්ධන නිළධාරියෙකු ඉන්දියාවේ කෙටිකාලීන පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීමට අවස්ථාව

ලැබුණි. මීට අමතරව ආයතනයේ විවිධ අංශවල හා නොයෙකුත් තරාතිරම්වල නිළධාරීන් හට ඔවුන්ගේ වෘත්තීය කුසලතා වැඩිදියුණු කර ගැනීම පිණිස අවශ්‍ය පුහුණුවීම්, සම්මන්ත්‍රන හා වැඩමුළුවලට සහභාගිවීම් ගණනාවකට සහභාගිවීමට අවස්ථාව ලැබුණි. ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති කරගෙන යාමත් නිළධාරීන් පුහුණු කිරීමේ කටයුතු කරගෙන යාමත් පිණිස ආයතනය ඉන්දියාවේ උක් පර්යේෂණ ආයතනය සහ පකිස්ථානයේ ආයුබ් කෘෂි  පර්යේෂණ ආයතනය, පකිස්ථානයේ උක් පර්යේෂණ ආයතනය සහ පකිස්ථානයේ පන්ජාබ් කෘෂි පර්යේෂණ මණ්ඩලය සමග සම්බන්ධතා තවදුරටත් වර්ධනය කර ගැනීමට මෙම වර්ෂය තුළ හැකියාව ලැබුණි

අධ්‍යක්ෂකගේ මෙම වාර්තාව, මෙම වකවානුව තුළ ආයතනයේ අධ්‍යක්ෂක හා ප්‍රධාන විධායක තනතුරෙහි වැඩ කටයුතු ආවරණය කල නියෝජ්‍ය අධ්‍යක්ෂක (පර්යේෂණ හා තාක්ෂණ සම්ප්‍රේෂණ) විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් පාදක කරගනිමින් සකස් කර ඇති



ආචාර්ය. එන්. සී. කුමාරසිංහ
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක

# ආංශික වාර්තා

## බෝග වැඩිදියුණු කිරීමේ අංශය

කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ඒ. විජේසූරිය මයා(කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති) | - | ප්‍රධාන පර්යේෂණ නිලධාරී සහ අංශ ප්‍රධානී |
| ඒ. එම්. එම්. එස්. පෙරේරා මෙනවිය (විද්‍යාවේදී) | - | පර්යේෂණ නිලධාරිනී |
| ඩී. මානෙල් මිය ( කෘෂිකර්ම විද්‍යාවේදී, විද්‍යාපති ) | - | පර්යේෂණ නිලධාරිනී (2012.07.30. සිට අධ්‍යයන නිවාඩු) |
| ඩබ්. එච්. ජයසිංහ මයා (විද්‍යාවේදී) | - | පර්යේෂණ නිලධාරී (2012.08.14 සිට) |
| ඒ. එල්. සී. කුමාරි මිය | - | තාක්ෂණ නිලධාරිනී |
| ඩී. වීරසිංහ මයා | - | තාක්ෂණ නිලධාරී |
| එල්. ඩී. ඩී. පී. ගුණරතන මිය( කෘෂිකර්ම ඩිප්ලෝමා) | - | තාක්ෂණ නිලධාරිනී |
| ඩබ්. පී. එම්. ජේ. පෙරේරා මයා | - | රසායනාගාර/ ක්ෂේත්‍ර උපස්ථායක |
| එස්. එච්. කරුණාරත්න මයා | - | රසායනාගාර/ ක්ෂේත්‍ර උපස්ථායක |

පර්යේෂණ ප්‍රගතියේ සංක්ෂිප්ත වාර්තා

- වානිජ වගාව සඳහා නව වැඩි දියුණු කරන ලද උක් ප්‍රභේද 3 ක් (එස්. එල්. 90 6237, එස්. එල්. 95 4443, එස්. එල්. 96 128) නිර්දේශ කර නිකුත් කරන ලදී.
- මුහුම් 200 කින් ලබාගත් සත්‍ය උක් බීජ පකිස්ථානයට අපනයනය කරන ලදී
- දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් යුත් උක් දර්ශ 1342 කින් සමන්විත වූ ජාන ප්ලාස්ම සංචිතය එනසාල්වත්තෙහි පිහිටි උක් අභිජනන උප මධ්‍යස්ථානයේ ස්ථානීය සංරක්ෂණය කරන ලදී.
- මාතලේ, නුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි සිදුකල ජාන ප්ලාස්ම ගවේෂණයෙන් උක් දර්ශ 96 ක් (94 Saccharum officinarum, 1 S spontanlum සහ1 Erianthus arundinaceus )එක් රැස් කරන ලදි.
- දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් යුත් උක් දර්ශ 217 ක අභිජනක අගය නිර්ණය කිරීම.
- උක් මුහුම් වැඩපිළිවෙල යටතේ එනසාල්වත්ත උප මධ්‍යස්ථානයේදී ක්ෂේත්‍ර ලන්තෑරුම් සහ දාවන මුහුම් ක්‍රම උපයෝගී කරගනිමින් මුහුම් 1463 ක් සිදුකරන ලදී



- එරිඇන්තස් අරුන්ඩිනේසියස් පිතෘ ශාකය ලෙස හා සැකරුම් ඔෆිසිනාරුම් මාතෘ ශාකය ලෙස යොදාගනිමින් කරන ලද අන්තර් ඝන මුහුම්කරණයෙන් සත්‍ය දෙමුහුම් 4 ක්ද සැකරුම් ස්පොන්ටේනියම් පිතෘ ශාකය ලෙස වානිජ දෙමුහුම් හෝ සැකරුම් ඔෆිසිනාරුම් මාතෘ ශාකය ලෙස යොදාගෙන සිදු කළ අන්තර් විශේෂ මුහුම්කරණයෙන් සත්‍ය දෙමුහුම් 43 ක් හඳුනාගන්නා ලදි

- උඩවලව, පැලවත්ත හා හිඟුරාන ක්ෂේත්‍රයන්හි වගාකරන ලද 2000 මුහුම් පෙළට අයත් ප්‍රචලිත ප්‍රභේද 24 ක් අතුරෙන් එස්. එල්. 00 354, එස්. එල්.00 401, එස්. එල්. 00 584, එස්. එල්. 00 619, එස්. එල්. 00 652 යන ඉහළ ගුණාත්වයෙන් යුත් උක් ප්‍රභේද 5 ක් හඳුනාගන්නා ලදි.

- කිනක රෝපන ක්‍රියාවලිය යටතේ උක් උපක්ලෝන 5820 ක් නිපදවන ලදි.

- එස්. එල්.95 4430 හා එස්. එල්. 95 4033 යන ප්‍රභේදයන්ගෙන් රෝග වලින් තොර වු පටක රෝපිත පැළ 2143 නිපදවන ලදි.

- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ උක් වගාව ව්‍යාප්තිය සඳහා රෝග වලින් තොර වු පටක රෝපිත පැල ලබාදෙන ලදි.

- ME, GDH, MDH හා පෙරොක්සිඩේස් එන්සයිම වර්ණගැන්වීමේ ක්‍රමය භාවිතා කොට උක් ප්‍රභේද 74 ක් අණුක ජීව විද්‍යා තාක්ෂණයෙන් වර්ගීකරණය කරන ලදි.

- දිශානුගත මුහුම් සිදුකිරීම සඳහා දෙමාපිය දර්ශ හා මුහුම් හඳුනාගන්නා ලදි.

- උඩවලව පර්යේෂණ ආයතනයේ ස්ථාපිත කරන ලද බීජ උක් තවාන් හෙක්. 5.5 ක උක් ප්‍රභේද 6 ක් ( එස්. එල්. 86 06, එස්. එල්. ටී. 121, එස්. එල්. 95 4033, එස්. එල්. 95 4430, එස්. එල්. 96 328, සී. ඕ. 775 සහ එස්. එල්. 96 128) රෝපණය කරන ලදි. සෙවනගල සීනි කර්මාන්තශාලාව සඳහා බීජ උක් ටොන් 65 ක් ලබා දෙන ලදි.

- කන්තලේ  ප්‍රදේශයට සුදුසු උක් ප්‍රභේද හඳුනාගැනීම සඳහා පර්යේෂණ හා පැළ තවාන් ආරම්භ කරන ලදි.

- උක් ශාකයේ අස්වනු සංරචකයන්හි ප්‍රමාණාත්මක ප්‍රවේණි සංරචකයන් වන ප්‍රවේණිකතාව, ප්‍රවේණික සහසම්බන්ධතාවයන් සහ වර්ණයට අපේක්ෂිත ප්‍රතිචාර ඇස්තමේන්තු කිරීම.

- උක් හකුරු කල් තබාගත හැකි කාලය නිර්ණය කරන ලදි.

# බෝග හා සම්පත් කළමණාකරන අංශය

කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ආචාර්ය ඩබ්. ආර්. ජී. විතාරම මයා<br>(කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරි) | - | ප්‍රධාන පර්යේෂණ නිලධාරි / අංශ ප්‍රධානී |
| ඒ. එල්. සී. ද සිල්වා මයා<br>(කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති) | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි |
| වි.කේ. එම්.ටී. කුමාරි මෙනවිය<br>( කෘෂිකර්ම විද්‍යාවේදී) | - | පර්යේෂණ නිලධාරි<br>(2012.08.14 සිට) |
| කේ. ඒ. ආරියරත්න මයා | - | තාක්ෂණ නිලධාරි |
| ඩබ්.ජී. නිමල් මයා | - | තාක්ෂණ නිලධාරි |
| බී. පී. ජී.එස්. සඳනායක මයා<br>(කෘෂිකර්ම ඩිපලෝමා) | - | තාක්ෂණ නිලධාරි |
| එස්. එම්. ඩී. එන්.ඩී. සෙනවිරත්න මයා<br>(කෘෂිකර්ම ඩිපලෝමා) | - | තාක්ෂණ නිලධාරි<br>(2012.08.14 සිට) |
| ඩබ්. ඒ. යූ. ප්‍රියන්ත මයා | - | තාක්ෂණ නිලධාරි |
| ජී. තිලකරත්න මයා | - | ට්‍රැක්ටර් රියදුරු(2012.01.20 සිට) |
| ඩබ්.එම්. ඒ. කේ. ප්‍රියශාන්ත මයා | - | ට්‍රැක්ටර් රියදුරු (2012.07.10 සිට) |
| එම්. එස්. එන්.විජේසිරි මයා | - | රසායනාගාර/ ක්ෂේත්‍ර උපස්ථායක |

පර්යේෂණ ප්‍රගතියේ සංක්ෂිප්ත වාර්තා

- වර්ෂා පෝෂිත වාරි පෝෂිත යන වගා ක්‍රම දෙක සඳහාම ඉහළ නිරි වගා අස්වැන්නක් ලබාගත හැකි නව උක් ප්‍රභේද ලෙස එස්. එල්. 90 6237 හා එස්. එල්. 93 945 යන නව උක් ප්‍රභේද හඳුනාගෙන තිබෙන අතර එස්. එල්. 92 4918 යන ප්‍රභේද වාරි පෝෂිත තත්ත්ව යටතේ පමණක් ඉහළ නිරි අස්වැන්නක් ලබාදෙන ප්‍රභේද ලෙස හඳුනාගෙන ඇත.

- වියළි උක් රොඩු හා ග්ලිරිසීඩියා මිශ්‍රකර වසුනක් ලෙස යෙදීම මගින් වර්ෂා පෝෂිත තත්ව යටතේදී පැල වගාවේ කැපී පෙනෙන ඉහළ උක් අස්වැන්නක් ලබාගත හැකි බව තහවුරු කරගන්නා ලදී




- මහා පරිමාණයේ වගාවන් වල උක් බීජ ක්ෂේත්‍ර සංස්ථාපනය හා ප්‍රචාරනය සඳහා පැල පරතර සහිතව සිටුවීමේ ක්‍රමය වානිජමය වශයෙන් වඩා ලාබදායි ක්‍රමයක් බවට තහවුරු කරගන්නා ලදි.

- 1997 හා 98 කාණ්ඩයන්ට අයත් උක් ප්‍රභේද 7 ක් මහා පරිමාණ වගා ක්ෂේත්‍රයන්හි ඇගයීම සඳහා උණුදිය ප්‍රතිකාර කරන ලද බීජ ටොන් 50 ක් සෙවනගල, පැලවත්ත හා හිඟුරාන උක් කර්මාන්ත ආයතන වෙත ලබාදෙන ලදි.

- 2011 අවුරුද්දේදී උක් පර්යේෂණ ආයතනය විසින් කිලිනොච්චි ප්‍රදේශයේ වගාකරන ලද උක් බීජ තවාන් 7 කින් කපාගන්නා ලද බීජ ටොන් 50 ක ප්‍රමාණයක්, අලුතින් හඳුනාගන්නා ලද නව වගා බිම් හෙක්ටයාර 8 ක (අක් 20) 2012 මහ කන්නයේදී අළුතින් වගා කරන ලදි. (වගා කරන ලද ප්‍රභේදය එස්. එල්. 83 06)

- කිරි හරක් සඳහා ආහාරයක් ලෙස උක් අස්වනු කපා ගැනීමේ දී ඉවතලන උක් කරටි මගින් සකසා ගන්නා ලද විශේෂිත ආහාර සලාකයක් සාර්ථකව යොදගත හැකි බව තහවුරු කරගන්නා ලදි.

විශ්ලේෂක සේවාවන්

- පර්යේෂණ ගොවිපලෙහි ඩී 3 හා ඩී 4 වාරි ඇළ ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තු සකසා අදල අනුමැතීන් සඳහා ඉදිරිපත්කොට ඇත.

- පර්යේෂණ කටයුතු සඳහා හෙක්ටයාර 15 ක බිම් ප්‍රමාණයක් දී ඇත.

- පර්යේෂණ වගා බිම් ආශ්‍රිතව ඇති මාර්ග පද්ධතිය වැඩි දියුණු කරන ලදි.

- ඩී 4 ප්‍රදේශය සඳහා නව විදුලි වැටක් සාර්ථකව ස්ථාපනය කරන ලදි.

- උක් ටොන් 185 ක් සෙවනගල සීනි කර්මාන්ත ආයතන වෙත හා ටොන් 25 ක් ග්‍රීන් වෙලි ආයතනය වෙත විකුණන ලදි.

- බීජ උක් ටොන් 65 ක් සෙවනගල සීනි කර්මාන්ත ආයතන වෙත ලබා දෙන ලදි.



# බෝග පෝෂණ අංශය

## කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| එච්. ඒ. එස්. වීරසිංහ මයා(බී.එස්.සී, එම්.ෆිල්,එම්.අයි බයෝ) | - කාර්යභාර පර්යේෂණ නිලධාරී |
| එච්. සිවසේගරම් මෙනවිය (බී.එස්.සී විශේෂ) | - පර්යේෂණ නිලධාරිනී (2012.08.20. සිට) |
| ඒ. පී. ජේ. මොහොට්ටි මයා | - තාක්ෂණ නිලධාරී |
| ජී. එස්. උඩවත්ත මයා | - තාක්ෂණ නිලධාරී |
| ජේ. ගුණසිරි මයා | - රසායනාගාර උපස්ථායක |
| පී. ඩබ්. ඩී. කුලතුංග මයා | - රසායනාගාර උපස්ථායක |

## පර්යේෂණ ප්‍රගතියේ සංක්ෂිප්ත වාර්තාව

- සෙවනගල උක් වගා කරන බිම් සඳහා නව පොහොර නිර්දේශ ලබා දීම.
- නව උක් ප්‍රභේද දෙකක් වන එස්. එල්. 96 128 හා එස්. එල්. 96 328 හි පැල වගාව සඳහා අවශ්‍ය ප්‍රශස්ථ නයිට්‍රජන් ප්‍රමාණය සොයා ගන්නා ලදි. එය 150 - 200 කිලෝ/ හෙක්. අතර අගයක් වේ.

## විශ්ලේෂක සේවාවන්

- උක් පර්යේෂණ ආයතනයේ අනෙකුත් අංශ මගින් ලැබුණු උක් නියැදි 1776 ක් සඳහා අවශ්‍ය රසායනික විශ්ලේෂක සේවාවන් (බ්‍රික්ස්, පොල් හා තන්තු) පරීක්ෂා කිරීම සිදු කරන ලදි.



# බෝග ආරක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ මිය (බී. එස්. සී විශේෂ) | - | කාර්යභාර පර්යේෂණ නිලධාරි |
| ඒ. එන්. ඩබ්. එස්. තුෂාරි මිය( බී. එස්. සී විශේෂ ) | - | පර්යේෂණ නිලධාරිනී |
| කේ. එම්. පී. චංචලා මෙනවිය.( බී. එස්. සී කෘෂිකර්ම) | - | පර්යේෂණ නිලධාරිනී (2012.05.21 දින සිට) |
| එම්.කේ.ඩී. උබේසේන මයා | - | තාක්ෂණ නිලධාරී |
| එම්.පී. ශිරෝමි මෙනෙවිය (කෘෂිකර්ම ඩිපලෝමා) | - | තාක්ෂණ නිලධාරී (2012.08.14 දින සිට) |
| එම්. ආර්. ප්‍රේමලාල් මයා | - | රසායනාගාර/ ක්ෂේත්‍ර සහායක |
| ඩී.එම්. ටී. පියරත්න මයා | - | ක්ෂේත්‍ර සහායක |

පර්යේෂණ ප්‍රගතියේ සංක්ෂිප්ත වාර්තාව

- එස්. එල්. 97 1442 යන උක් ප්‍රභේදය වූල් කුඩිත්තාට අධික ලෙස පාත්‍රවන ප්‍රභේදයක් ලෙස හඳුනා ගැනීම.

- 2000 වර්ෂයේදී ස්ථාපිත කරන ලද එස්. එල්. 00 859, එස්. එල්. 00 127 සහ එස්. එල්. 00 401 යන ප්‍රභේද තුනෙහි අධික ලෙස වූල් කුඩිත්තා ගහනයන් වාර්ථා විය.

- උක් වගාවේ කළු දුඹුල් රෝගයට අදළව ප්‍රභේද 45 ක්ද, ශල්ක පත්‍ර ප්‍රදහයට අදළව ප්‍රභේද 38 ක්ද, වරණීය කටයුතු සඳහා යොද ගන්නා ලදි.

- දේශිය උක් ප්‍රභේද එකතු කිරීමේ ව්‍යාපෘතියේදී එකතු කරන ලද ප්‍රභේදයන්හි රෝග හා පලිබෝධ නිරීක්ෂණය කර දත්ත රැස් කිරීම.



- පකිස්ථානයෙන් ගෙන්වන ලද ප්‍රභේද 59 ක් නිරෝධායන කටයුතු වලින් අනතුරුව අනෙකුත් පර්යේෂණ කටයුතු සඳහා යොදගැනීමට අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලදි.

- වියට්නාමයෙන් ආනයනය කරන ලද උක් ප්‍රභේද තුනෙහි (ආර්.ඕ. සී. 23, වී. එන්. 84 4137, ක්‍යු. ඩී 93 159) ඇති වූ හඳුනා නොගත් රෝගයක් හේතුවෙන් ශාක නිරෝධායන මධ්‍යස්ථානය තුළදී සම්පූර්ණයෙන් විනාශ කොට ඉවත් කරන ලදී.

- වූල් කුඩිත්තා ස්වාභාවිකව මර්ධනය කිරීම සඳහා යොද ගන්නා ස්වාභාවික විලෝපිකයන්ගේ ගහනයන් වෙනස්වීම පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයට අනුව, විවිධ විලෝපිකයන්ගේ වැඩිම ගහනයන් පහත පරිදි වාර්තා විය.

| විලෝපිකයා | වැඩිම ගහනය වාර්තා වූ කාලය | ප්‍රමාණය (ගස් 10 ක) |
|---|---|---|
| ඩයිෆා ඇපිඩිවෝරා | දෙසැම්බර් මාසයේ දෙවැනි සතිය | කීටයින් 55 |
| මයික්‍රෝමස් <u>Micromus sp</u> | නොවැම්බර් මාසයේ පළමු සතිය. | කීටයින් 81 |
| සීපිඩි මැස්සන් (වටබමන මැස්සන් | ජනවාරි මාසයේ දෙවැනි සතිය | කීටයින් 25 |

- රූපවිද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය මගින් සුදුපත්‍ර රෝග වාහකයා වන ඩෙල්ටසේෆල්ස් මෙනෝනි නැවත තහවුරු කර ගැනීම සහ විද්‍යාගාරය තුළ ගුණනය කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම. (රූපසටහන. 01)




රූපසටහන 1 :ඩෙල්ටසේෆල්ස් මෙනෝනි (හෙමිප්ටෙරා : සිකඩලිඩේ), ගේ රූපවිද්‍යාත්මක ලක්ෂණ

a. උදරීය ව්‍යුහය b. පෘෂ්ඨීය ව්‍යුහය c. පාර්ශවීය ව්‍යුහය d.සුහුඹුල් පිරිමි සතා (තද පැහැති, සාපේක්ෂව කුඩා) e. සුහුඹුල් ගැහැණු සතා (ලා පැහැති, සාපේක්ෂව විශාල) f. ශිශු අවධිය g.ප්‍රජනන ව්‍යුහය (ගැහැණු) h. ප්‍රජනන ව්‍යුහය (පිරිමි) i.ඇන්ටනා

- <u>ඩෙල්ටසෙෆලස් මෙනෝනි</u> උඩවලව ප්‍රදේශයේ වැඩි ගහන තත්වයක් පෙන්වන කාල සීමාවන් හඳුනාගැනීම නොවැම්බර් මස 3 - 4 සතිවල ඉහළ ගහනයන් (46 කෘමීන්/ නෙට් 2000) පෙන්වන අතර ජූලි මස 3- 4 සතිවල අවම ගහන ගනත්වයක් (කෘමීන් වාර්තා වී නැත) පෙන්වයි.

විශ්ලේෂක සේවාවන්

- උක් පළිබෝධකයන් සහ උන්ගේ ස්වාභාවික සතුරන් පිළිබඳව වසර පුරා සිදුකළ සමීක්ෂණ වලට අනුව පහත පරිදි පළිබෝධකයින්ගේ ගහනයන් දක්නට ලැබුණි.

➢ එස්.එල්.අයි.121, එස්.එල්.92 4918, එස්.එල්. 95 4430, එස්.එල්.96 061 එස්.එල්. 96 128, එස්.එල්.96 328 යන උක්වගා වූල් කුඩිත්තාට සමාන්‍ය පාත්‍රිතාවයක් උඩවලව ප්‍රදේශයේදී පෙන්වන අතර එස්.එල්.96 128 උක් ප්‍රභේදය පැල්වත්ත ප්‍රදේශයේ දී සී.ඕ. 527 සහ එස්.එල්. 83 06 යන ප්‍රභේද පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දී වූල් කුඩිත්තාට වැඩි පාත්‍රියතාවයක් පෙන්වයි.

| පළිබෝධ හානිය | ස්ථානය | උක් ප්‍රභේද |
|---|---|---|
| වූල් කුඩිත්තා | උඩවලව | එස්.එල්.අයි.121<br>එස්.එල්.92 4918<br>එස්.එල්. 95 4430<br>එස්.එල්. 96 128<br>එස්.එල්.96 328 |
| | පැල්වත්ත | එස්.එල්. 96 128 |
| | පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සී.ඕ. 527<br>එස්.එල්. 8306 |

- පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ උක් වගාවන්හි ප්‍රරෝහ විදින පණුවාගේ හානිය වාර්තා නොවූ අතර කඳන් විදින පණුවා සහ පයිරිල්ලා පත්‍ර කීඩෑවාගේ හානිය ඉතාමත් සුළු වශයෙන් සී.ඕ. 527 සහ එස්.එල්. 83 06 යන උක් ප්‍රභේදයන්හි වාර්තා වූ අතර පයිරිල්ලා ස්වාභාවිකව මර්ධනය සඳහා දායක වන එපිරිකානියා මෙලනොලියුකා(Epiricamia melanoleuca) වාර්තා නොවීය.

- පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ උක් වගාවන් ආශ්‍රිත ඇති වූ වූල් කුඩිත්තා හා හඳුනා නොගත් පළිබෝධ හානි පාලන සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම.

- උක් වගාවේ රෝග සම්බන්ද සමීක්ෂණ කටයුතු නිරන්තරයෙන් සිදු කරමින් අදළ රෝග පාලනය සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම.

- ඒකාබද්ධ පළිබෝධ හා රෝග පාලනය සම්බන්ධව ගොවීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 09 ක් සඳහා දායකත්වය ලබාදීම.

## යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| කේ.එච්.ඩී. අබේරත්න මයා(කෘෂිකර්ම විද්‍යාවේදී) | - | කාර්යභාර්ය පර්යේෂණ නිලධාරී |
| කේ.ටී. ආරියවංශ මයා (කෘෂිකර්ම විද්‍යාවේදී, විද්‍යාපති) | - | පර්යේෂණ නිලධාරී<br>(2012.08.14 සිට) |
| ඒ. එස්. එම්. ඒ. ප්‍රනාන්දු මයා(තාක්ෂණික ඩිපලෝමා) | - | තාක්ෂණ නිලධාරී |
| ඩබ්. එම්. අනුරපාල මයා | - | තාක්ෂණ නිලධාරී |
| වී. අබේගුණවර්ධන මයා | - | පෑස්සුම්කරු |
| ජී. ආරියරත්න මයා | - | වෑද්දුම්කරු |
| ඩබ්. ඒ. ජේමචන්ද්‍ර මයා | - | කම්මල්කරු |

ඩී.එම්. එල්. වීරසිරි මයා - කාර්මික(2012.10.15 සිට)

එම්. බී. රොහාන් මයා - රසායනාගාර/ ක්ෂේත්‍ර උපස්ථායක

ඩී. එම්. වීරසිරි මයා - රසායනාගාර/ ක්ෂේත්‍ර උපස්ථායක

පර්යේෂණ ප්‍රගතියේ සංක්ෂිප්ත වාර්තාව

- දෙරෝද ට්‍රැක්ටරයට සවි කළ හැකි හැසිරවීමට පහසු හා සුදු යකඩයෙන් නිමවූ ට්‍රැක්ටරයේ වේගය අනුව පොහොර පතිත වීම ස්වයංක්‍රීයව පාලනය වන අඩු වියදම් පොහොර යොදනයක් නිෂ්පාදනය කිරීම.

විශ්ලේෂක සේවාවන්

- බෝග වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර කුඩු රාමු 32 ක් නිෂ්පාදනය කිරීම.
- ප්‍රචලිත කිරීමේ අරමුණින් ගොවීන් අතර බෙද දීම සඳහා ටයින් කල්ටිවේටර 20 ක් හා ඇලි සාදන උපකරණ 20 ක් නිෂ්පාදනය කිරීම.
- දෙනියාය එනසාල්වත්ත අභිජනන උප මධ්‍යස්ථානයේ යකඩ රාමු වලින් සමන්විත වර්ග අඩි 400 ක තාවකාලික නිවහනක් ඉදිකිරීම.
- අත්තිවාරම් බීජ උක් ගොවිපල හා පර්යේෂණ ගොවිපල උක් වගා සඳහා විදුලි වැට ස්ථාපනය කිරීම.
- අත්තිවාරම් බීජ උක් ගොවිපල සඳහා ඉඩම් හෙක්ටයාර 5 ක් පමණ සංවර්ධනය කිරීම.
- අත්තිවාරම් බීජ උක් ගොවිපල සඳහා ජලය ගෙන යන ඩී 04 ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.
- උක් හකුරු නිෂ්පාදන ඒකකයේ නව උඳුන් චිමියක් ස්ථාපනය, උක් ඇඹරුම් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම හා උඳුන් නැවත නිර්මාණය කර ඉදිකිරීම.
- පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය යාන්ත්‍රික සේවාවන් සැපයීම.
- උක් පර්යේෂණ ආයතනයේ වාහන හා ගොවිපල උපකරණ නඩත්තු හා අළුත්වැඩියා කටයුතු කිරීම.





## සැකසුම් තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

එච්. එම්. ජී. පී. හේරත් මයා ( කෘෂිකර්ම විද්‍යාවේදී) - පර්යේෂණ නිලධාරි (2012.08.14 සිට)

පර්යේෂණ ප්‍රගතියේ සංක්ෂිප්ත වාර්තාව

- වැඩි දියුණු කරන ලද යීස්ට් මාදිලියක් නිපදවා ගැනීම සඳහා යීස්ට් මාදිලි 26 ක් විසංගමනය කිරීම සහ එම යීස්ට් මාදිලි වගා කිරීම.
- ජෛවීය පොහොර නිශ්පාදනය කිරීම සඳහා පොස්පේට් දිය කිරීමේ හැකියාව ඇති බැක්ටීරියා විශේෂ 96 ක් විසංගමනය කිරීම සහ එම බැක්ටීරියා විශේෂ වගා කිරීම.

## ආර්ථික විද්‍යා, ජීවමිතික හා තොරතුරු තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

බී. ඩී. එස්. කේ. ආරියවංශ මිය ( විද්‍යාවේදී උපාධි) - කාර්යභාර්ය පර්යේෂණ නිලධාරි

කේ. ඒ. ඩී. කොඩිතුවක්කු මයා ( විද්‍යාවේදී උපාධි) - පර්යේෂණ නිලධාරි ( 2012.02.15 සිට අධ්‍යන නිවාඩු)

එම්. ජී. වයි. මාධවී මෙනවිය ( විද්‍යාවේදී උපාධි) - තාක්ෂණ නිලධාරි (2012.08.01.දක්වා)

පර්යේෂණ ප්‍රගතියේ සංක්ෂිප්ත වාර්තාව

- 2012 වර්ෂයට අදාලව හිඟුරාන, පැල්වත්ත සහ සෙවනගල ප්‍රදේශවල උක් වගාවේ ආදයම හා වියදම ඇගයීමට ලක් කරන ලදි.
  මෙහිදී හිඟුරාන හා සෙවනගල වාරිපෝෂිත උක් වගාවලට අදළ පිරිවැය ප්‍රතිලාභ අනුපාතය දෙකට ආසන්න අගයක් ගත් අතර සෙවනගල හා පැල්වත්ත වාරිපෝෂිත උක් වගාවන්ට අදලව පිරිවැය ප්‍රතිලාභ අනුපාතය පිළිවෙලින් 1.7 හා 1.6 විය.
- පසුගිය වසර 25 කාල පරාසය තුල උඩවලව ප්‍රදේශයේ වර්ෂාපතන රටාවේ ඇති ලාක්ෂණික ගුණාංග අධ්‍යයනය කරන ලදි.
  - ජනවාරි 15 සිට මාර්තු 11 දක්වා කාලය තුළ සහ ජුනි 11 සිට සැප්තැම්බර් 23 අතර කාලය තුළ වැසි රහිත දින පැවතීම සඳහා 75% ට වැඩි සම්භාවිතාවයක් ඇත.
  - උඩවලව ප්‍රදේශයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය ± සම්මත දෝෂය අගය 1486.1 ± 52.2 mm වේ. මෙම අගය පරාසය උක් වගාව සඳහා හිතකර මට්ටමේ පවතී.
  - " යල කන්නයේ " හා " මහ කන්නයේ " වැසි පටන් ගැනීම හා අවසාන වීම සිදු වන කාල පරාස පහත පරිදි වේ
    - "මහ කන්නයේ " ආරම්භ වීමේ සාමාන්‍ය දිනය සැප්තැම්බර් අවසාන සතිය තුළ ද" යල කන්නයේ " වැසි පටන් ගැනීමේ සාමාන්‍ය දිනය මාර්තු තුන්වන සතිය තුළ ද වේ.

- ඔක්තෝම්බර් දෙවන සතිය වන විට " මහ කන්නයේ " වැසි ද මාර්තු මස හතර වන සතිය වන විට " යල කන්නයේ " වැසි ද ආරම්භවීම සඳහා 75% සම්භාවිතාවයක් ඇත.

- පෙබරවාරි දෙවන සතිය වන විට පෙර " මහ කන්නයේ " වැසි ද ජුනි මස දෙවන සතිය වන විට " යල කන්නයේ " වැසි ද අවසාන වීම සඳහා 75% සම්භාවිතාවයක් පවතී.

විශ්ලේෂක සේවාවන්

- ආයතනයිය වෙබ් අඩවිය පවත්වා ගෙන යාම හා යාවත්කාලීන කිරීම.

  - www.sugarres.lk යන වෙබ් ලිපිනය යටතේ ලියාපදිංචිව ඇති ආයතනයේ වෙබ් අඩවිය, අවශ්‍ය පරිදි යාවත්කාලීන කරන ලදී.

- ආයතනයේ අනෙකුත් අංශ සඳහා සේවා සැපයීම.

  - බෝග වැඩි දියුණු කිරීමේ අංශය, බෝග සම්පත් කළමනාකරණ අංශය, බෝග ආරක්ෂණ අංශය හා බෝග පෝශණ අංශය සඳහා පර්යේෂණ සැළසුම් සකස් කර දීම.

  - ප්‍රාථමික අස්වනු පර්යේෂණ හා ප්‍රතිවලිත අස්වනු පර්යේෂණ වල දත්ත විශ්ලේෂණ කිරීම.

  - බෝග ආරක්ෂණ, බෝග සම්පත් කළමනාකරණ, බෝග පෝෂණ හා යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශයන් සඳහා පර්යේෂණ දත්ත විශ්ලේෂණය කර දීම.

  - ආයතනය තුළ තොරතුරු තාක්ෂණ කටයුතු ක්‍රියාවට නැංවීම.

- අනෙකුත් ආයතන සඳහා සේවා සැපයීම.

  - **INFORM** දත්ත ගබඩාව සැකසීම

    ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව ( CARP ) ආයතනය මගින් ගොනු කරන ජාතික පර්යේෂණ තොරතුරු ජාලයට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා 2012 වර්ෂයට අදාළව උක් පර්යේෂණ ආයතනයේ INFORM පරිගණක දත්ත ගබඩාව සකස් කිරීම සඳහා තොරතුරු එක් රැස් කිරීම. 2011 වර්ෂයට අදාළ **INFORM** දත්ත ගබඩාව තථ්‍ය දත්ත භාවිතයෙන් යාවත්කාලීන කිරීම.

  - ඇඹිලිපිටිය බෝධිරාජ වෘත්තීය පුහුණු ආයතනයේ ( VTA ) ශිෂ්‍යාවකට මාස 09 ක පරිගණක යෙදයුම් සහායක පුහුණුවක් ලබා දීම.

# තාක්ෂණ සම්ප්‍රේෂණ හා සංවර්ධන අංශය

කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| එම්. එස්. පෙරේරා මයා (කෘෂිකර්ම විද්‍යාවේදී, දර්ශනපති) | - ප්‍රධාන පර්යේෂණ නිලධාරී/අංශ ප්‍රධානී |
| ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල මයා (කෘෂිකර්ම විද්‍යාවේද) | - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී |
| ආර්. ඒ. පී. ඒ. රණතුංග මයා (කෘෂිකර්ම ඩිප්ලෝමා) | - සංවර්ධන නිලධාරී |
| කේ. පී. වික්‍රමසිංහ මයා (කෘෂිකර්ම විද්‍යාවේදී) | - සංවර්ධන නිලධාරී |
| එස්. එන්. වික්‍රමසිංහ මයා (කෘෂිකර්ම විද්‍යාවේදී, විද්‍යාපති) | - සංවර්ධන නිලධාරී |
| ඩබ්ලිව්. පී. එම්. එස්. වේරගොඩ මයා (කෘෂිකර්ම විද්‍යාවේදී) | - සංවර්ධන නිලධාරී |
| ආර්. ඒ. ප්‍රේමචන්ද්‍ර | - තාක්ෂණ නිලධාරී |

පර්යේෂණ ප්‍රගතියේ සංක්ෂිප්ත වාර්තා

- නව උක් ප්‍රභේද ප්‍රචලිත කිරීම ( එස්. එල්. අයි. 121, එස්. එල්. 83 06, එස්. එල්. 88 116, එස්. එල්. 92 4918, එස්. එල්.92 4997, එස්. එල්. 92 5588, එස්. එල්.95 4430, එස්. එල්. 95 4433, එස්. එල්. 96 128, එස්. එල්. 96 328)
    - උක් ප්‍රභේද සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 14 ක් සෙවනගල සියඹලාණ්ඩුව සහ හිඟුරාණ ප්‍රදේශයන්හි ස්ථාපිත කිරීම. ( එස්. එල්. අයි. 121, එස්. එල්. 83 06, එස්. එල්. 88 116, එස්. එල්. 92 5588, එස්. එල්. 96 128)
    - හෙක්ටයාර එක බැගින් වූ ප්‍රභේද ගුණනය කිරීමේ ක්ෂේත්‍ර 2 ක් සෙවනගල හා පැල්වත්ත ප්‍රදේශයන්හි ස්ථාපිත කිරීම.( එස්. එල්. අයි. 121, එස්. එල්. 83 06, එස්. එල්. 88 116, එස්. එල්. 92 4918, එස්. එල්.92 4997, එස්. එල්. 96 128, එස්. එල්. 96 328)
    - ක්ෂේත්‍ර නිලධාරීන් 73 ක් සහ ගොවීන් 555 ක් සඳහා නව උක් ප්‍රභේද සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 21 ක් පැවැත්වීම.
    - ගුණනය සඳහා නව උක් ප්‍රභේද වල ටොන් 63 ක් සහ කර්මාන්තශාලා වලට සැපයීම. ( එස්. එල්. 83 06 ,එස්. එල්. 88 116, එස්. එල්. 92 5588, එස්. එල්. 96 128)
    - සියඹලාණ්ඩුව, පැල්වත්ත, හිඟුරාණ, සෙවනගල සහ පස්සර ප්‍රදේශයන්හි ස්ථාපිත කළ ක්ෂේත්‍ර ආදර්ශන සහ ගුණනය කිරීමේ ක්ෂේත්‍ර 10 ක් අධීක්ෂණය කිරීම.
    - නව උක් ප්‍රභේද පිළිබඳ තොරතුරු පත්‍රිකා 7 ක් ප්‍රකාශයට පත් කිරීම. (එස්. එල්. 89 1673, එස්. එල්. 92 4918, එස්. එල්.92 4997, එස්. එල්. 92 5588, එස්. එල්.95 4430, එස්. එල්. 95 4433, එස්. එල්. 96 328)
- ටයින් කල්ටිවේටර ( TYNE CULTIVATOR) සහ ඇලි සාදන (FURROW OPENER) උක් වගාකරුවන් අතර ප්‍රචලිත කිරීම.
    - ටයින් කල්ටිවේටර 9 ක් ගොවීන් වෙත ලබාදීම.
    - පැල්වත්ත සහ හිගුරාණ ප්‍රදේශයන්හි ගොවීන් 112 ක් සඳහා ටයින් කල්ටිවේටර සහ ඇලි සාදනය සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 8 ක් පැවැත්වීම.
- උක් වගාව සමග අතුරු බෝග වගාව ප්‍රචලිත කිරීම.

- ➢ පැල්වත්ත ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද අතුරු බෝග වගා ආදර්ශන 20 ක් අධීක්ෂණය කිරීම.
- ➢ අතුරු බෝග වගා සම්බන්ධ ප්‍රතිඵල ආදර්ශන 2 ක් හිඟුරාණ ප්‍රදේශයේ ගොවීන් 16 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම.
- ➢ අතුරු බෝග වගා සම්බන්ධ ප්‍රතිඵල ආදර්ශන 2 ක් පැල්වත්ත ප්‍රදේශයේ ගොවීන් 16 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම.
- ➢ අතුරු බෝග (රටකජු, පිපිඤ්ඤා සහ කව්පි) වගා කිරීම සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 46 ක් පැල්වත්ත" සියඹලාණ්ඩුව හා හිඟුරාණ ප්‍රදේශයන්හි ස්ථාපිත කිරීම.



- ➢ අතුරු බෝග වගා සම්බන්ධ ක්‍රම ආදර්ශන 6 ක් හිඟුරාණ ප්‍රදේශයේ ගොවීන් 207 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම.
- ➢ අතුරු බෝග වගා සම්බන්ධ ක්ෂේත්‍ර චාරිකා 4 ක් හිඟුරාණ ප්‍රදේශයේ ගොවීන් 90 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම.
- ➢ අතුරු බෝග වගා කිරීමේ නිර්දේශ අවධාරණය සඳහා ක්ෂේත්‍ර දින 2 ක් හිඟුරාණ ප්‍රදේශයේ ගොවීන් 63 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම.

- පසේ සාරවත් බව කළමනාකරණය සඳහා ගොවීන් දැනුවත් කිරීම.
  - ➢ පොහොර යෙදීම සහ පාංශු සාරවත් බව කළමනාකරණය සම්බන්ධ ක්‍රම ආදර්ශන 12 ක් හිඟුරාණ ප්‍රදේශයේ ක්ෂේත්‍ර නිලධාරීන් 31 ක් සහ ගොවීන් 202 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම.
  - ➢ ගොවි ක්ෂේත්‍ර 13 ක් අධීක්ෂණයකොට පොහොර යෙදීම සහ පාංශු සාරවත් බව කළමනාකරණය සම්බන්ධ උපදෙස් ලබාදීම.

- පරතරයක් ඇතිව සිටුවීමේ ක්‍රමය ( **SPACED PLANTING TECHNIQUE** ) ප්‍රචලිත කිරීම.
  - ➢ පරතරයක් ඇතිව සිටුවීමේ ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා සියඹලාණ්ඩුව හා හිඟුරාණ ප්‍රදේශයන්හි ගොවීන් 205 දෙනෙකු වෙනුවෙන් සම්බන්ධ ක්‍රම ආදර්ශන 13 ක් පැවැත්වීම.
- උක් වගාවේ නිර්දේශිත ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුවර්තනය වැඩිදියුණු කිරීම.
  - ➢ පැල්වත්ත ප්‍රදේශයේ ගොවීන් 40 දෙනෙකු වෙනුවෙන් ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම සහ රෝග/පළිබෝධ පාලනය සම්බන්ධ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
  - ➢ පැල්වත්ත, හිඟුරාණ, පස්සර සහ සියඹලාණ්ඩුව ප්‍රදේශයන්හි ගොවීන් 542 වෙනුවෙන් ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම සහ රෝග/පළිබෝධ පාලනය සම්බන්ධ ගොවි පුහුණු වැඩසටහන් 26 ක් පැවැත්වීම.

- පැල්වත්ත සහ හිගුරාණ ප්‍රදේශයන්හි ගොවීන් 90 වෙනුවෙන් දෙනෙකු වෙනුවෙන් ක්ෂේත්‍ර දින 4 ක් පැවැත්වීම.

- බුත්තල, ඇතිමලේ සහ පස්සර උක් ගොවීන්ගේ දරුවන් 240 ක් වෙනුවෙන් උක් වගා කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 9 ක් පැවැත්වීම.

- ගිනි නොතබා උක් නෙලමු" සහ "උක් වගාවේ වල් මර්දනය" යන තොරතුරු පත්‍රිකා වල පිටපත් 1000 බැගින් නැවත මුද්‍රණය කිරීම.

- උක් වගාවේ රෝග සහ පළිබෝධ පාලනය සම්බන්ධව ගොවීන්ගේ දැනුම වැඩිදියුණු කිරීම.

  - පැල්වත්ත ප්‍රදේශයන්හි ගොවීන් 25 දෙනෙකු වෙනුවෙන් උක් වගාවේ රෝග සහ පළිබෝධ පාලනය කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
  - ගල්ඔය වැවිලි සමාගම සහ සෙවනගල සීනි කර්මාන්තායතනයන්හි ක්ෂේත්‍ර නිලධාරීන් 35 දෙනෙකු වෙනුවෙන් උක් වගාවේ සුදු පත්‍ර රෝග පාලනය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් 2 ක් පැවැත්වීම.
  - හිගුරාණ ප්‍රදේශයන්හි ගොවීන් 12 වෙනුවෙන් උක් වගාවේ සුදු පත්‍ර සහ කළු දුඹුලු රෝග පාලනය සම්බන්ධ ආදර්ශන සැසියක් පැවැත්වීම.
  - පැල්වත්ත ප්‍රදේශයන්හි ගොවීන් 30 දෙනෙකු වෙනුවෙන් උක් වගාවේ වූල් කුඩිත්තා ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම සම්බන්ධව ක්‍රම ආදර්ශනයක් පැවැත්වීම.
  - පැල්වත්ත, හිගුරාණ, පස්සර සහ සියඹලාණ්ඩුව ප්‍රදේශයන්හි ගොවීන් 600 ක් වෙනුවෙන් රෝග හා පළිබෝධ පාලනය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් 24 ක් පැවැත්වීම.
  - රෝග පාලනය සම්බන්ධව ගොවීන් දැනුවත් කිරීම සඳහා පැල්වත්ත" හිගුරාණ සහ සියඹලාණ්ඩුව ප්‍රදේශයන්හි ගොවි ක්ෂේත්‍ර 240 ක් නිරීක්ෂණයකොට උපදෙස් ලබාදීම.
  - සුදු පත්‍ර රෝග පාලනය පිළිබඳ පෝස්ටර් 1000 ක් මුද්‍රණය කිරීම සහ ඒවා පැල්වත්ත, හිගුරාණ, පස්සර සහ සියඹලාණ්ඩුව ප්‍රදේශවල ප්‍රදර්ශනය කිරීම.
  - කළු දුඹුලු රෝගය පිළිබඳ පෝස්ටර් 1000 ක් මුද්‍රණයකොට ඒවා උක් වගාකරන ප්‍රදේශයන්හි ප්‍රදර්ශනය කිරීම.

- උක් හකුරු නිශ්පාදනයේ ගුණාත්මකබව ඉහළ නැංවීම.

  - ඉහළ ගුණාත්මයකින් යුතුව උක් හකුරු නිපදවීම සම්බන්ධව පුහුණු වැඩසටහන් 4 ක් ගොවීන් 131 දෙනෙකු වෙනුවෙන් පැවැත්වීම.
  - ඉහළ ගුණාත්මයකින් යුතුව උක් හකුරු නිපදවීම සම්බන්ධව ක්‍රම ආදර්ශන 3 ක් පැවැත්වීම්
  - නව උක් ප්‍රභේද සම්බන්ධව ක්ෂේත්‍ර ආදර්ශන 20 ක් (හෙ.0.1 බැගින්) පස්සර ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.( එස්. එල්. 83 06, එස්. එල්. 88 116, එස්. එල්.95 4430, එස්. එල්. 96 128)
  - පස්සර ප්‍රදේශයේ උක් හකුරු නිපදවීම හා අළෙවි කිරීමේ සඵලතාවය අධීක්ෂණය කිරීම.
  - පස්සර ප්‍රදේශයේ උක් ගොවීන් උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද ණය ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සමාලෝචනය සඳහා ගොවි හමුවක් පැවැත්වීම සහ උක් පර්යේෂණායතනය මගින් දියර ඉසින යන්ත්‍ර 8 ක් ගොවි සංවිධාන වෙත ලබාදීම.

- ණය ලබාගැනීමට අයදුම් කළ ගොවීන්ගේ ක්ෂේත්‍ර නිරීක්ෂණය කිරීම්

- සීනි නර්මාන්තශාලා සහ අනෙකුත් අදාල ආයතනවල ඉල්ලීම පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීම/සේවා සැපයීම සහ ප්‍රදර්ශන පැවැත්වීම.

  - ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයෙහි අනුග්‍රහය ඇතිව සෙවනගල, පැල්වත්ත, හිඟුරාණ සහ සියඹලාණ්ඩුව ප්‍රදේශයන්හි ගොවීන් 240 ක් වෙනුවෙන් පුහුණු වැඩසටහන් 6 ක් පැවැත්වීම.

  - සබරගමු විශ්ව විද්‍යාලයෙහි සිසු කණ්ඩායම් 2 ක් සඳහා උක් වගා කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 2 ක් පැවැත්වීම.

  - ගල්ඔය වැවිලි සමාගමේ ක්ෂේත්‍ර නිලධාරීන් 16 ක් සඳහා බීජ උක් නිශ්පාදනය සම්බන්ධ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

  - උඩවලව හමුදා කඳවුරට අනුබද්ධ නිලධාරීන් 7 දෙනෙකු වෙනුවෙන් උක් වගා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

  - පුවත් හසුන (5-1 වෙලුම) ප්‍රකාශයට පත්කිරීම්

  - පහත සඳහන් ප්‍රදර්ශන වලට සහභාගී වීම්

    - දැයට කිරුළ ප්‍රදර්ශනය - 2012
    - දිරි උදාන ප්‍රදර්ශනය - ඇඹිලිපිටිය
    - සියවසි සැමරුම ප්‍රදර්ශනය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය
    - සියවසි සැමරුම (සුබෝධාරාම පිරිවෙන) - බෝම්බුවල



# පාලන හා ගිණුම් අංශය

කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ආචාර්ය එන්. සී. කුමාරසිංහ මහතා<br>බීඑස්සී, එම්එස්සී, පීඑච්ඩී, එෆ්ආර්ඊඑස් (යූකේ)<br>එෆ්අයිබීඅයිඕඑල්, එෆ්ඒඑස්එන් වරලත් ජීව විද්‍යාඥ | - | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක |
| ආචාර්ය ඒ. පී. කීර්තිපාල මහතා<br>බීඑස්සී (කෘෂිකර්ම) එම්පීඑල් පීඑච්ඩී | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>(පර්යේෂණ හා තාක්ෂණ සම්ප්‍රේෂණ) |
| ඩී. ජ. මානමුදලි මහතා<br>බීඒ (ආර්ථික විද්‍යා) විශේෂ, එල්අයිසීඒ | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා මුදල්) |

<u>පාලන කාර්ය මණ්ඩලය</u>

| | | |
|---|---|---|
| ආචාර්ය සී. එපිටවෙල මහතා (පී. එච්. ඩී. මොස්කව්) | - | පරිපාලන නිලධාරි |
| ටී. එච්. ඩී. එම්. ජයතිලක මහත්මිය | - | කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) |
| ජේ. කේ. චන්ද්‍රලතා මහත්මිය | - | කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) |
| ටී. එම්. කේ. සේනාධීර මහත්මිය | - | කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) |
| එම්. එම්. අයි. එම්. කේ. මැණික්කඩවර මෙනවිය | - | කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) |
| පී. සෝමවීර මහතා | - | කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) |
| එම්. ඒ. ආර්. සමරසේකර මෙනවිය | - | කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) |
| ඕ. යූ. සුභසිංහ මහත්මිය | - | කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) |
| එස්. බී. එන්. යූ. එස්. විමලසූරිය මහතා | - | රියදුරු |
| ඔස්ටින් පෙරේරා මහතා | - | රියදුරු |
| ඒ. ඩබ්ලිව්. කේ. හෙට්ටිආරච්චි මහතා | - | රියදුරු |
| එස්. එල්. පීරිස් මහතා | - | රියදුරු |
| එච්. ඒ. යූ. එස්. ප්‍රේමරත්න මහතා | - | රියදුරු |
| ජේ. පී. එස්. පී. කරුණාතිලක මහතා | - | රියදුරු |
| ටී. පී. කේ. ජයරත්න මහතා | - | රියදුරු |
| ආර්. පී. ඩී. ඒකනායක මහතා | - | රියදුරු |
| එස්. ඒකනායක මහතා | - | රියදුරු |
| එච්. එන්. ඒ. ප්‍රසන්න මහතා | - | රියදුරු (2012.07.16 දින සිට) |
| පී. ඩබ්ලිව්. එම්. පී. එස්. මානවඩු මහතා | - | රියදුරු (2012.07.16 දින සිට) |
| එච්. එස්. ඒ. එස්. කුමාර මහතා | - | රියදුරු (2012.07.16 දින සිට) |

ගිණුම් කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ඩී. එම්. සිරිපාල මහතා (බීකොම්) | - | ගණකාධිකාරි |
| ජී. එම්. එස්. නන්දදේව මහතා | - | කළමනාකාරණ සහකාර (ගිණුම්) |
| ඒ. කේ. අමරකෝන් මහත්මිය | - | කළමනාකාරණ සහකාර (ගිණුම්) |
| එල්. කේ. එස්. දයානන්ද මහතා | - | කළමනාකාරණ සහකාර (ගිණුම්) |
| ඩී. එම්. පී. නික්ෂන් මහතා | - | කළමනාකාරණ සහකාර (ගිණුම්) |
| ටී. රංජිත් පීරිස් මහතා | - | කළමනාකාරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය) |

ගබඩාව

| | | |
|---|---|---|
| ආර්. පී. නිරෝෂන් මහතා | - | ගබඩා භාරකරු |
| එස්. ඒ. සේනාරත්න මහතා | - | පොදු කම්කරු (ගබඩා) |

අභ්‍යන්තර විගණන ඒකකය

| | | |
|---|---|---|
| එස්. පී. වයි. මුනීන්ද්‍ර මහතා<br>අයිසීඒ (ඉන්ටර්මීඩියට්) එම්ඒඒටී | - | අභ්‍යන්තර විගනක |

ප්‍රසම්පාසන ඒකකය

| | | |
|---|---|---|
| එච්. පී. ආර්. කුමාර මහතා<br>බී.බී.(මැනේජ්මන්ට්) | - | ප්‍රසම්පාදන නිලධාරි |

නඩත්තු ඒකකය

| | | |
|---|---|---|
| ඩී. එච්.එස්. විජේසිංහ මහත්මිය | - | වැඩ පරීක්ෂක |
| බී. විතාරන මහතා | - | වැඩ පරිපාලක |
| ජී. ගමගේ මහතා | - | විදුලි කාර්මික |
| ආර්. පාලමුර් මහතා | - | විදුලි කාර්මික |
| ජේ. වික්‍රමාරච්චි මහතා | - | පෙදරේරු/වඩු කාර්මික |
| ඩී. ඩබ්ලිව්. එස්. චින්තන මහතා | - | වඩු කාර්මික |
| ආර්. පී. කුලතුංග මහතා | - | වඩු කාර්මික |
| ඩී. එච්. ධර්මදාස මහතා | - | ජල පොම්ප ක්‍රියාකරු |
| එච්. පී. චන්ද්‍රවංශ මහතා | - | ජල පොම්ප ක්‍රියාකරු |
| කේ. එච්. වීරරත්න මහතා | - | ජල පොම්ප ක්‍රියාකරු |
| ආර්. එම්. ප්‍රියන්ත මහතා | - | පොදු කම්කරු |
| එම්. ඒ. පී. රණසිංහ මහතා | - | පොදු කම්කරු |

<u>වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි සාරාංශය</u>

- රත්මලාන කාර්යාලයේ සෙස් එකතුකිරීමේ කාර්යයට පමණක් සීමාකර වියදම් අඩු කිරීම සඳහා අනෙකුත් කාර්ය මණ්ඩලය උඩවලව ප්‍රධාන කාර්යාලයට මාරුකිරීමට කටයුතු කිරීම.
- පුරප්පාඩු 23 ක් පුරවන ලද අතර සේවකයින්ගේ බොහොමයක් දුක්ගැනවිලි නිරවුල් කිරීමට කටයුතු කිරීම.
- එන්සල්වත්ත උක් අභිජනන උප මධ්‍යස්ථානයේ ස්ථිර ගොඩනැගිල්ලේ ඉදිකිරීම මූලාරම්භ කිරීම.
- තනි කැබ් රථ දෙකක් මිලදීගැනීම සහ ඩබල් කැබ් රථ දෙකක් මිලදීගැනීම සඳහා කටයුතු කිරීම.
- පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනයේ කාර්ය සංවිධාන සංග්‍රහය සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- අයවැය ලේඛණය සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, වත්කම් සත්‍යාපනය කිරීම සහ කළමනාකරණ තොරතුරු සැපයීම
- එදිනෙදා පරිපාලන ක්‍රියාමාර්ග කරගෙනයාම, පිරිස් කළමනාකරණය, නඩත්තු කටයුතු සහ ආයතනයේ සුබ සාධන කටයුතු කිරීම.

මූල්‍ය කටයුතු පිළිබඳ සමාලෝචනය

- ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගයවන සෙස් ආදායම මෙම වර්ෂය තුලදී රුපියල් මිලියන 165.7 ක් වූ අතර එය 2011 වර්ෂය තුළ මිලියන 169.0 ක් විය. මෙලෙස පසුගිය වර්ෂයට වඩා ආදායම රුපියල් මිලියන 3.3 කින් පහත වැටීමකි.
- පසුගිය වසරේදී රුපියල් මිලියන 19.4 ක්වූ අතිරික්තය හා සැසඳීමේදී මෙම වසරේ ශුද්ධ ඌනතාවය රුපියල් මිලියන 7.9 ක් විය. මෙම ඌනතාවයට ප්‍රධානම හේතුව වූයේ ආයතනයේ මෙහෙයුම්, වියදම් වැඩිවීමයි. මෙම වසර තුළ දී ප්‍රාග්ධන ආයෝජනය රුපියල් මිලියන 10.6 ක් විය.

2012 වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැටුම

<u>කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම හා අභිප්‍රේරණය</u>

කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්

| | | | |
|---|---|---|---|
| ආචාර්ය ඒ.පී. කීර්තිපාල | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ සම්ප්‍රේෂණ) | 2012.01.02 |
| ඒ. උපුල් චමින්ද කුමාර මහතා | - | පොදු කම්කරු | 2012.01.03 |
| පී. තිලකරත්න මහතා | - | ට්‍රැක්ටර් රියදුරු | 2012.01.20 |
| කේ.එම්.පී. චංචලා මෙනවිය | - | පර්යේෂණ නිලධාරී | 2012.05.21 |
| ටී.ඩබ්ලිව්.එම්.පී. විජේතුංග මහතා | - | තාක්ෂණ නිලධාරී | 2012.05.28 |
| ඩී.එම්. නිලන්ත සමන් කුමාර මහතා | - | තාක්ෂණ නිලධාරී | 2012.05.28 |
| එච්.එන්.ඒ. ප්‍රසන්න මහතා | - | රියදුරු | 2012.07.10 |
ii). කළමනාකාර සහකාර (ලිපිකරු/ගිණුම්), පොත් තබන්නා, ගිණුම් නිලධාරී යන තනතුරු පුරප්පාඩු වීම හේතු කොටගෙන ගිණුම් අංශයේ මුදල් ගණුදෙණු හා ගිණුම්කරන කාර්යයන්ට අදාළව නිසි වැඩ බෙදීමක් දක්නට නොලැබුණි.

iii). ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය පුරප්පාඩු වීම හේතුවෙන් 2012 වර්ෂය වෙනුවෙන් පොත් තැබීම හා අවසන් ගිණුම් පිළියෙල කිරීමේ කාර්යය බාහිර විගණන ආයතනයක් මගින් රු.250,000 ක ගිවිසගත් මුදලකට පැවරීමට සිදුවී තිබුණි.

(වයිඑස්/එෆ්/එස්ආර්අයි/ජ්කිව්/2012/05)

## (ඇ) නඩත්තු ඒකකය

i) ආයතනයට අදාළ කාර්යාල ගොඩනැගිලි, නිල නිවාස හා කාර්යාල භූමියට අයත් සියළුම නඩත්තු කටයුතු හා සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධ කාර්යයන් ආයතනයේ නඩත්තු ඒකකය මගින් සිදුකරනු ලබන අතර එහි වැඩ කටයුතු වැඩ අධිකාරී වරයෙකු භාරයේ පැවතිය යුතු වුවත් මෙහි වැඩකටයුතු සිදුවන්නේ වැඩ පරීක්ෂක නිලධාරිනියක මගිනි.

ii) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා පමණක් නඩත්තු හා ඉදිකිරීම් ක්‍රියාකාරකම් සැලසුම් කර තිබූ අතර එම කාලය තුළ මෙම ඒකකය විසින් නඩත්තු කාර්යයන් 12 ක් සිදුකිරීමට සැලසුම් කර තිබුණද ඒ සඳහා අවශ්‍ය වන ශ්‍රම ඒකක ප්‍රමාණයන්, ද්‍රව්‍ය ප්‍රමාණයන් ඒවා අවශ්‍ය කාලයන් හා ඊට අදාළ අයවැය පිරිවිතරයන් දැක්වෙන පරිදි ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හේතුවෙන් නඩත්තු ඒකකය තුළ අයවැය පාලනයක් සිදුවී නොතිබුණි.

iii) නඩත්තු ඒකකය විසින් නිමකරන ලද නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම ගෙවීම් වවුචර් මගින් හඳුනාගැනීමෙන් පසු ගිණුම් ගත කර තිබූ නමුත් සත්‍ය වශයෙන්ම එක් එක් කාර්යය වෙනුවෙන් වැය වූ වියදම වෙන වෙනම හඳුනාගැනීමක් සිදුනොවීම හේතුවෙන් කාර්යයන් අතර වියදම් පාලනයක් සිදුවී නොතිබුණි.

iv) සමාලෝචිත වර්ෂය තුළ ඉටුකිරීම සඳහා සකස් කළ යෝජිත වැඩ සැලැස්ම තුළ අන්තර්ගත වැඩසටහන් 03 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(වයිඑස්/එෆ්'/එස්ආර්අයි/ජ්කිව්/2012/02)

**(ඇ) වාහන අලුත්වැඩියාව**

i) ආයතනය සතු වාහන වල අලුත්වැඩියා කටයුතු ආයතනයේ යාන්ත්‍රික තාක්ෂණ අංශය මගින් මෙන්ම ආයතනයට පරිබාහිර වූ වෙනත් ආයතන මගින් ද ඉටුකරවා ගැනීම සිදු කෙරෙයි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ යාන්ත්‍රික තාක්ෂණ අංශය මගින් සිදුකර තිබූ වාහන අලුත්වැඩියාවන් 96 කට අදාලව වියදම් ඇස්තමේන්තුවක්, දැරූ පිරිවැය හඳුනාගැනීම සඳහා වූ පිරිවැය ගිණුම්කරන ක්‍රමවේදයක් ආයතනය තුල නොවිය.

ii) එක් එක් වාහනය සම්බන්ධයෙන් බාහිර ආයතන මගින් සිදුකල සමහර අළුත්වැඩියාවන්ට අදාල වටිනාකම් එම එක් එක් වාහන ලිපිගොණුවේ දක්නට නොලැබුණි.

(වයිඑස්/එෆ්'/එස්ආර්අයි/ජ්කිව්/2012/06)

**(ඉ) ගබඩා අංශය**

ආයතනයේ ප්‍රධාන ගබඩාවට අදාලව තොග වාර්තා පවත්වාගැනීමට විධිමත් බින්කාඩ් පද්ධතියක් නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඊ) ස්ථාවර වත්කම් ලේඛණය**

i) ආයතනයේ දැනට පවතින ස්ථාවර වත්කම් ලේඛණය 2011 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි.

ii) අවසන් වරට යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛණය ද අඩුපාඩු වලින් සමන්විත වූ අතර එහි, ආයතනයේ භෞතිකව නොමැති වත්කම් සටහන්ව තිබූ අතර එසේම භෞතිකව පවතින නමුත් ලේඛණයෙන් මගහැරුණු වත්කම් ද පවතින බව නිරීක්ෂණය විය.

iii) ආයතනයේ ගබඩා අංශය වෙත ලැබී නිකුත් කරන ස්ථාවර වත්කම් නියි සංකේතකරණයකින් තොරව නිකුත් කරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(වයිඑස්/එෆ්'/එස්ආර්අයි/ජ්කිව්/2012/07)

## 2.5 හඳුනාගත් පාඩු

ආයතනය සතුව සංචිත වාහන 23 ක් පැවතිය දිත් රු.108,830 ක වියදමක් දරා බාහිර ආයතන වෙතින් ප්‍රවාහන පහසුකම් සපයාගෙන තිබුණි. එසේම එම පහසුකම් ලබාගත් නිලධාරීන් කවුරුන්ද යන්න හා එම ප්‍රවාහන පහසුකම් ලබාගෙන තිබුණේ කුමන කාර්යයක් සඳහාද යන්න ගෙවීම් වවුචර් මගින් තහවුරු කර නොතිබුණි.

(වයිඑස්/එෆ්'/එස්ආර්අයි/ජ්කිව්/2012/05)

## 0.3 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 7,900,416 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ රු.19,495,035 ක අතිරික්තයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.27,395,451 ක පිරිහීමට සෙස් ආදායම රු.4,795,630 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.22, 197,015 කින් වැඩිවීම (පෞද්ගලික පඩිනඩි රු.10,424,071 කින් වැඩිවීම, විදේශ ගමන් රු.3,906,167 කින් වැඩිවීම, නඩත්තු රු.3,891,296 කින් වැඩිවීම, පර්යේෂණ හා සංවර්ධන රු. 3,975,481 කින් වැඩිවීම) බලපා තිබුණි.

### 3.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

(අ) 1981 අංක 75 දරණ උක් පර්යේෂණ පනතේ 5 (2) වගන්තිය ප්‍රකාරව එහි පාලක මණ්ඩලයේ සංයුතිය තිරණය කෙරේ. උක්ත වගන්තියේ (අ) උප වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යක්ෂ දක්ෂතාවන්ගෙන් යුත් උසස් විද්‍යාඥයන් අතුරෙන් සාමාජිකයින් තිදෙනෙක් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය. කෙසේ නමුත් අමාත්‍යවරයා විසින් එසේ පාලක මණ්ඩලයට පත්කරනු ලැබූ සාමාජිකයන්ගෙන් දෙදෙනෙකු ප්‍රත්‍යක්ෂ දක්ෂතාවන්ගෙන් යුත් උසස් විද්‍යාඥයන් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(වයිඑස්/එෆ්'/එස්ආර්අයි/ජීකිව්/2012/08)

(ආ) ආයතනය සතු මෝටර් රථ 23 ක් පවතින අතර ඉන් වාහන 09 ක ධාවන සටහන් වල නියැදියක් පරීක්ෂා කිරීමේදී අමාත්‍යවරයාගේ රාජකාරී කටයුතු වෙනුවෙන් යැයි සදහන් කරමින් එම වාහන වරින් වර භාවිතාකර තිබුණු අතර එසේ ධාවනය කර තිබූ කිලෝමීටර ප්‍රමාණය 35,064 ක් විය.

(වයිඑස්/එෆ්'/එස්ආර්අයි/ජීකිව්/2012/06)

## 3.5 උක් දඩු මිලදී ගැනීමේ ක්‍රමවේදය

**(අ)** සීනි සමාගම් වශයෙන් ක්‍රියාත්මක වන පැලවත්ත,සෙවනගල, හිඟුරාන සීනි සමාගම් උක් අස්වැන්න මිලදී ගැනීමේදී උක් දඬුවල බර පමණක් සැලකිල්ලට ගෙන උක් දඬු මිලදීගෙන තිබූ අතර උක් දඬුවල අඩංගු සීනි සංයුතිය සලකා මිල තීරණය කර නොතිබුණි.

(ආ) උක් පර්යේෂණ ආයතනය පසුගිය වසර 15 ක කාලය තුළ විශාල පර්යේෂණ වියදමක් දරා වැඩි සීනි සංයුතියක් සහිත උක් ප්‍රභේද ගණනාවක් හඳුන්වා දී ඇතත් ගොවීන් වගාව සඳහා උක් ප්‍රභේද තෝරාගැනීමේදී උක් ගස්වල අඩංගු සීනි සංයුතිය නොසලකා උක් ගසේ බර හා විශාලත්වය පමණක් සැලකිල්ලට ගෙන බීජ හා රෝපණ ද්‍රව්‍ය වගාවට යොදාගෙන තිබුණි.

(ඇ) වැඩි ඵලදාවක් සහිත උක් ප්‍රභේද වගාව සඳහා යොදා නොගැනීමෙන් උක් වගා බිම්වල හෙක්ටයාරයකින් ලබාගත හැකි සීනි ටොන් ප්‍රමාණය අඩු වී ඇති බව නිරීක්ෂණය විය.

මේ තත්ත්වය උක් වගාකල මුළු භූමි ප්‍රමාණයත් එහි ව්‍යාප්ත වී ඇති උක් ප්‍රභේදයන් පරීක්ෂා කිරීමේදීත් පැහැදිලි වේ. 2011/2012 වන විට උක් වගාව ව්‍යාප්ත වී ඇති ආකාරයත් ව්‍යාප්ත වී ඇති උක් ප්‍රභේදයේ විශේෂ ලක්ෂණ යනාදියත් පහත දැක්වේ.

| උක් ප්‍රභේදය | උක් ප්‍රභේදය හඳුන්වා දුන් වර්ෂය | උක් ප්‍රභේදයේ වැදගත් ලක්ෂණ | | | | උක් වගාව ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ හෙක්ටයාර | | | එකතුව හෙක්ටයාර |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අස්වැන්න හෙක්ටයාරයකට මෙ.ටො. | | | රෝග හා පළිබෝධකයින්ට ඔරොත්තු දීමේ හැකියාව | සෙවනගල | පැල්වත්ත | ගල් ඔය | |
| | | | උක් | සීනි | | | | | |
| SL-96128 | 2012 | වාරි පෝෂිත<br>වර්ෂා පෝෂිත | 120<br>95 | 14<br>11.8 | රෝග හා පළිබෝධකයන්ට ප්‍රතිරෝධීතාවය සාමාන්‍ය මට්ටමක පවතී. | 4.3 | 248 | - | 252 |
| SL-96328 | 2011 | වාරි පෝෂිත<br>වර්ෂා පෝෂිත | 120<br>90 | 14.4<br>12.0 | රෝග හා පළිබෝධකයන්ට ප්‍රතිරෝධීතාවය වැඩියි. | 83 | 525 | 160 | 768 |
| SL -92-5588 | 2009 | වාරි පෝෂිත<br>වර්ෂා පෝෂිත | 115<br>80 | 14<br>8.5 | රෝග හා පළිබෝධකයන්ට ප්‍රතිරෝධීතාවය වැඩියි. | 0.25 | 3 | - | 3.25 |
| Co-775 | - | වාරි පෝෂිත<br>වර්ෂා පෝෂිත | 100<br>- | 10.66<br>- | රෝග හා පළිබෝධකයන්ට ඔරොත්තු දීමේ හැකියාව අඩුයි.දැනට විශාල ලෙස පැතිරී යන සුදු පත්‍ර රෝගයට ඉක්මනින්ම ගොදුරුවන ප්‍රභේදයකි. | 1564 | 16 | 892 | 2472 |
| M-43859 | - | වාරි පෝෂිත<br>වර්ෂා පෝෂිත | 75<br>- | -<br>- | සුදු පත්‍ර රෝගයට ඉක්මනින්ම ගොදුරුවන ප්‍රභේදයකි. | 5 | 2070 | 145 | 2220 |
| SL-8306 | 1994 | වාරි පෝෂිත<br>වර්ෂා පෝෂිත | -<br>70 | -<br>8.6 | රෝග හා පළිබෝධකයන්ට ප්‍රතිරෝධීතාවය වැඩියි. | 338 | 2762 | 68 | 3168 |
| SL-92-4997 | 2009 | වාරි පෝෂිත | 110 | 14 | - | - | - | - | - |
| SL-92-4918 | 2009 | වාරි පෝෂිත | 110 | 12 | - | - | - | - | - |
| SL-89-1673 | 2009 | වාරි පෝෂිත<br>වර්ෂා පෝෂිත | 100 | 11 | - | - | - | - | - |
| SL-8613 | 2002 | වාරි පෝෂිත | 106 | 10 | - | - | - | - | - |
| SLT-88238 | 2002 | වාරි පෝෂිත<br>වර්ෂා පෝෂිත | 80 | 8.2 | - | - | - | - | - |
| SL-88116 | 2001 | වාරි පෝෂිත | 98 | 11 | - | - | - | - | - |
| අනෙකුත් ප්‍රභේද | - | - | - | - | - | 66.45 | 199 | 164 | 429.45 |
| මිශ්‍ර ප්‍රභේද | - | - | - | - | - | - | 1237 | 122 | 1359 |

ඉහත වගුවේ විස්තර අනුව පැහැදිලි වන්නේ Co- 775 නමැති උක් ප්‍රභේදය හෙක්ටයාර 2472 ක භූමි ප්‍රදේශයක ව්‍යාප්ත වී ඇතත් එම ප්‍රභේදයෙන් හෙක්ටයාරයකට ගතහැකි සීනි ප්‍රමාණය මෙ.ටො. 10.67 ක් පමණ අඩු මට්ටමක පවතින බවත් SL-8306 ප්‍රභේදය හෙක්ටයාර 3168 ක භූමි ප්‍රමාණයක ව්‍යාප්ත වී ඇති අතර හෙක්ටයාරයකට මෙ.ටො.8.6 ක පමණ සීනි ප්‍රමාණයක් පමණක් ලබාගත හැකි බවත්ය. නමුත් මෑතකාලීනව හඳුන්වා දුන් උක් ප්‍රභේදයන්ගෙන් හෙක්ටයාරයකට ගත හැකි සීනි ප්‍රමාණය වැඩි බව පහත තොරතුරු මගින් පැහැදිලි වේ.

| උක් ප්‍රභේදය | හඳුන්වාදුන් වර්ෂය | හෙක්ටයාරයකට සීනි ප්‍රමාණය මෙ.ටො. | ව්‍යාප්ත වී ඇති හෙක්ටයාර ප්‍රමාණය |
|---|---|---|---|
| SL-92 5588 | 2009 | 14 | 3.25 |
| SL-92 4997 | 2009 | 14 | - |
| SL-96328 | 2011 | 14.4 | 768 |

වඩා වැඩි සීනි ප්‍රමාණයක් සහිත උක් ප්‍රභේද හඳුන්වා දී තිබියදී එම ප්‍රභේද වල ව්‍යාප්තියේ මන්දගාමී බව නිසා දැනට වගාකර ඇති ඉඩම් වලින් ලැබෙන සීනි ප්‍රමාණය අඩු වීම දේශීය සීනි නිෂ්පාදනය අඩුවීමට බලපාන ලද එක් හේතුවක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(වයිඑස්/එෆ්/එස්ආර්අයි/ජකිව්/2012/09)

## 3.6 කාර්යසාධනය

### අ) ඉංජිනේරු අංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

මෙම අංශය මගින් උක් වගාවට අදාළ යන්ත්‍ර සූත්‍ර පිළිබඳ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම හා ඊට අදාළ උපකරණ නිපදවීම සිදුකරනු ලබයි.ඊට අමතරව ආයතනයේ මෝටර් රථ වාහන නඩත්තු කටයුතු සිදු වන්නේද මෙම ඒකකය මගිනි. 2012 වර්ෂය තුළ මෙම අංශය විසින් පර්යේෂණ ව්‍යාපෘති හා පර්යේෂණ සේවා ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.ඒ සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ විගණන පරීක්ෂාවේදී පහත දැ නිරීක්ෂණය විය.

### i) උක් අස්වනු යන්ත්‍රයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (MT/01/11)

උක් අස්වනු නෙළීමේ ශ්‍රම පිරිවැය ඉහළ බැවින් අස්වනු නෙළීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම හා උක් නෙළීමේ පිරිවැය අඩුකිරීමේ අරමුණ ඇතිව ඉකුත් වර්ෂවල සිට දේශීය වගා භූමි සඳහා ගැලපෙන ආකාරයට උක් අස්වනු නෙළීමේ යන්ත්‍රයක් නිපදවා අත්හදා බැලීම් සිදුකර තිබූ අතර 2012 වර්ෂයේදී ද එම අවශ්‍යතාවය හඳුනාගෙන ඉදිරියටත් එය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව රු. මිලියන 0.44 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද මෙම පර්යේෂණ ව්‍යාපෘතියට අදාළ කිසිදු කාර්යක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

ii) උක් රොඩු කපන යන්ත්‍රයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (MT/02/11)

උක් රොඩු ගිණිතැබීම මගින් ඒවා ඉවත් කිරීම, ගොවින් අතර පවතින සාමාන්‍ය ක්‍රමවේදය වන අතර එසේ සිදු කිරීම නිසා පසේ සාරවත් භාවය අඩුවීම හා පාංශු ඛාදනයට ඉඩ සැලසෙන බැවින් ඒලන තිරි වගාවට එය හානිදායක ලෙස බලපායි. එබැවින් ඉහත තත්වයන්ට මුහුණදීමේ සාර්ථක පිළියමක් වශයෙන් හා ශ්‍රම පිරිවැය අවම කර ගැනීමේ අරමුණින් ආයතනය විසින් ඉහළ කාර්යක්ෂමතාවයක් ඇති උක් රොඩු කැපීමේ යන්ත්‍රයක් හඳුන්වාදීමට සැලසුම් කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 0.56 ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ව්‍යාපෘතියට අදාළ මූලික වැඩ සැලැස්මක් පමණක් නිර්මාණය කර තිබුණි.

iii) උක් බීජ වෙන් කිරීමේ උපකරණයක් නිර්මාණය කිරීම හා සැකසීම.

මෙම ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 0.81 ක් වෙන් කර තිබුණද 2012 වර්ෂය තුළ ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

iv) ටයින් කල්ටිවේටර් නිපදවීමේ ව්‍යාපෘතිය (MT/RS/01/12)

උක් වගාවන් හි පෙළ අතර වල් නෙළීම සඳහා හා පස සැකසීම ඉතා කාර්යක්ෂමව ක්‍රමවත් ලෙස අවම පිරිවැයකට සිදුකිරීම සඳහා ආයතනය විසින් ටයින් කල්ටිවේටරයක් නමැති උපකරණයක් හඳුන්වා දී තිබුණි. මෙම ව්‍යාපාතියට අනුව සමාලෝචිත වර්ෂයේ ටයින් කල්ටිවේටර 20 ක් නිපදවීම සඳහා සැලසුම් කර තිබුණද 2012 වර්ෂයේදී කිසිදු ටයින් කල්ටිවේටර් උපකරණයක් නිපදවා නොතිබුණි.

(ආ) ආයතනය සතුව ද්‍රාව පීඩන යන්ත්‍රයක් (Hydraulic pressing machine) නොමැතිවීම නිසා යාන්ත්‍රිකරණ හා තාක්ෂණික අංශයේ කාර්යන් සඳහා අවශ්‍ය වන යකඩ නැවීම්, එහි සේවයේ නියුතු සේවකයින් ඉතා අධික වෙහෙසක් දරා සිදුකරන අතර ඒ වෙනුවෙන් විශාල ශ්‍රම කාලයක් හා ශ්‍රම පිරිවැයක් දැරීමට සිදුවන බව යාන්ත්‍රිකරණ හා තාක්ෂණික අංශය මගින් පෙන්වා දී තිබුණි. ඒ අනුව එම යන්ත්‍රයෙහි අවශ්‍යතාවය දක්වමින් ඉල්ලීම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය අදාල අංශය වෙත ලැබී නොතිබුණි .

(වයිඑස්/එෆ්/එස්ආර්අයි/ඒකිව්/2012/03)

3.7 අතහැර දමා තිබූ ව්‍යාපෘති

(අ) 2012 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | වෙන්කළ ප්‍රතිපාදනය රු. |
|---|---|
| විද්‍යාගාර සංකීර්ණයක් හා සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම -උඩවලව | 65,000,000 |
| කෘමිත් අධ්‍යනය කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,000,000 |

(ආ) උක් මල් මුහුන් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.2,000,000 ක අයවැය ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද වර්ෂය අවසාන වන විටත් අදාල ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. මෙහි මුල් ගල තැබීමේ සමාරම්භක උලෙලේ වියදම් සඳහා රු.179,505 ක් 2012 වර්ෂයේදී දරා තිබුණි.

(වයිඑස්/එෆ්/එස්ආර්අයි/ජකිව්/2012/04)

## 04. කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය තත්ත්වය පහත පරිදි වේ.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 06 | 03 |
| තෘතියික මට්ටම | 25 | 19 | 06 |
| ද්විතික මට්ටම | 52 | 36 | 16 |
| ප්‍රාථමිකමට්ටම | 107 | 102 | 05 |
| | 193 | 163 | 30 |

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාල වන තනතුරු 30 ක් පුරප්පාඩුව පැවතුණි.

## 05 පද්ධති හා පාලන

| | |
|---|---|
| ගිණුම්කරණය | ලෙජරයට පිටපත් කිරීමේ දෝෂ පැවතීම. |
| සෙස් ආදායම | සැසඳුම් වාර්තා පවත්වාගෙන නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛණය | ක්‍රමවත්ව පවත්වාගෙන නොතිබුණි. |
| ගබඩාකරණය. | වාර්තා නිසි පරිදි පවත්වාගෙන නොතිබුණි. |

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: වයිඑස්/එෆ්/එස්ආර්අයි/එෆ්ජ්/2012
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date: 2013 අගෝස්තු ෆ් දින

සභාපති,
උක් පර්යේෂණ ආයතනය

**උක් පර්යේෂණ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

උක් පර්යේෂණ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 75 දරන උක් පර්යේෂණ පනතේ 19(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපතිවරයා වෙත 2013 අප්‍රේල් 02 දින නිකුත් කරන ලදි.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்-அஞ்சல் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගනණයේ විෂය පථය සහ ප්‍රමාණය තිරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012, දෙසැම්බර් 31 දිනට උක් පර්යේෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනයේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන සෙස් බදු ආදායම, මුදල් පදනම මත ගිණුම් ගත කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වී තිබුණි. එම ප්‍රතිපත්තියට අදාල නොවී සමාලෝචිත වර්ෂය තුළ ලැබිය යුතු වූ රු.5,057,250 ක සෙස් බදු ආදායම මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.5,057,250 කින් වැඩි වී එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය අඩු වී ජංගම වත්කම් වැඩි වී තිබුණි.

2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2011 වර්ෂයේ දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ රු.68,000,000 ක මුදල එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නිසි පරිදි ගැලපීම් කර තිබුණද 2012 වර්ෂයේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ ආරම්භක ශේෂයට එය එකතු කර සමාලෝචිත වර්ෂයේ ලබාදුන් මුදලක් වශයෙන් නැවත අඩුකර දක්වා තිබුණි.

(ආ). 2013 වර්ෂයේ දී මිලදී ගන්නා ලද රු.6,500,000 ක් වටිනා මෝටර් රථ 02 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර තිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් හා වගකීම් රු.6,500,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

2.2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). <u>ලැබිය යුතු ගිණුම්</u>

2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ණයගැති කාල විශ්ලේෂණය වෙනස් නොකර 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟද ඉදිරිපත් කර තිබුණි. නිවැරදි ණයගැති කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2 ත් වර්ෂ 5 ත් අතර කාල පරාසයකට අයත් රු.1,955,612 ක ශේෂයක් හා වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන රු.5,100 ක ණයගැති ශේෂයක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ). <u>ගෙවිය යුතු ගිණුම්</u>

ණයහිමියන්ගේ ශේෂවල එකතුව වූ රු.8,737,186 කින් එකතුව රු.881,222 ක ණය ශේෂ 4 ක් වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන නමුත් එම ණයහිමි ශේෂයන් පියවීමට පියවර ගෙන නොතිබුණි.

2.2.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| <u>විෂයය</u> | <u>වටිනාකම</u> (රු.) | <u>ඉදිරිපත් නොවූ සාක්ෂි</u> |
|---|---|---|
| ණයගැතියෝ | 2,147,456 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| ණයහිමියෝ | 8,737,186 | ශේෂ සනාථ කිරීමේ ලිපි |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 7,900,416 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ රු.19,495,035 ක අතිරික්තයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.27,395,451 ක පිරිහීමක් නිරීක්ෂණය විය.සමාලෝචිත වර්ෂයේ සෙස් බදු ආදායම රු.4,795,630 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.22, 197,015 කින් ද විදේශ ගමන් වියදම් රු.3,906,167 කින් ද, නඩත්තු වියදම් රු.3,891,296 කින් ද පර්යේෂණ හා සංවර්ධන වියදම් රු. 3,975,481 කින් වැඩිවීම මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය පිරිහීමට බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) විදේශ ගමන්, ප්‍රවාහන වියදම් හා පර්යේෂණ වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 417 ක් ද සියයට 50 ක් ද හා සියයට 67 ක් ද වශයෙන් වැඩිවී තිබුණි.

(ආ) 2013 වර්ෂයට අදාල උපචිත වියදමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් වීම නිසා ගෙවිය යුතු ගිණුම් සියයට 117 කින් වර්ධනය වී තිබුණි.

### 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) ආයතනයේ සේවය කල පුද්ගලයන් දෙදෙනෙකුට එරෙහිව ආයතනය විසින් නඩු විෂයයන් දෙකක් පවරා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නඩු විභාග වෙමින් පැවතුණි.

(ආ) ආයතනය හැර ගිය නිලධාරිනියකට එරෙහිව රු.2,974,960 ක වන්දි මුදලක් ඉල්ලා ආයතනය විසින් නඩුවක් පවරා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නඩු විභාග වෙමින් පැවතුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) සෙස් බදු මුදල් රැස් කිරීම

රේගු දෙපාර්තමේන්තුව සමඟ බැදුම්කරයට යටත්ව මහා පරිමාණිකව සීනි ආනයනය කරන ව්‍යාපාරිකයන් විසින් සීනි ආනයනය කර බන්ධිත ගුදම්වල තැන්පත් කරනු ලබන අතර එම සීනි තොග සඳහා සෙස් බදු මුදල් අය කර ගනු ලබන්නේ ඒවා නැවත බන්දිත ගුදම් වලින් නිකුත් කිරීමේදිය. ඉහත කී මහා පරිමාණිකව සීනි ආනයනය කිරීම්වලට අදාල වාර්තා ආයතනය විසින් රේගුවෙන් ලබාගෙන ඒට අදාල නිකුත් කිරීම් (Ex bond Sales) සමඟ සැසඳීමක් සිදු කර නොතිබුණි. එමනිසා ඉහත කී මුළු සීනි තොගයන් සඳහා සෙස් බදු මුදල් නැවත කොටස් වශයෙන් අයකර ගෙන ඇති බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

#### (ආ) තඩත්තු ඒකකය

(i) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා පමණක් තඩත්තු හා ඉදිකිරීම් ක්‍රියාකාරකම් 12 ක් සිදුකිරීමට සැලසුම් කර තිබු අතර ඒ සඳහා අවශ්‍ය වන අයවැය පිරිවිතරයන් දැක්වෙන පරිදි ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ii) තඩත්තු ඒකකයේ සමස්ථ වියදම හඳුනාගෙන තිබුණද එක් එක් කාර්යයන්ගේ වියදම වෙන වෙනම හඳුනා නොගැනීම හේතුවෙන් කාර්යයන් අතර වියදම් පාලනයක් සිදුවී නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීම සඳහා සකස් කල යෝජිත ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත වැඩසටහන් 03 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

#### (ඇ) ගබඩා අංශය

ආයතනයේ ප්‍රධාන ගබඩාවට අදාලව තොග වාර්තා පවත්වාගැනීමට විධිමත් බින්කාඩ් පද්ධතියක් නොතිබුණි.

(ඇ) **ස්ථාවර වත්කම් ලේඛණය**

(i) **ආයතනය විසින්** යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛණයේ සමහර වත්කම් **භෞතිකව නොතිබුණු** අතර භෞතිකව පවතින සමහර වත්කම් ලේඛණයෙන් මගහැරී **තිබුණි.**

(ii) **ආයතනයේ ගබඩා අංශයෙන්** නිකුත් කරන ස්ථාවර වත්කම් විධිමත් සංකේතකරණයකින් තොරව නිකුත් කර තිබුණි.

4.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) උක් පර්යේෂණ ආයතනය පසුගිය වසර 15 ක කාලය තුල විශාල පර්යේෂණ වියදමක් කර වැඩි සීනි සංයුතියක් සහිත උක් ප්‍රභේද ගණනාවක් හදුන්වා දී තිබුණද, එම ප්‍රභේදයන් ගොවීන් අතර ව්‍යාප්ත නොවීම නිසා පර්යේෂණ වල ප්‍රතිඵල සාර්ථක ලෙස ක්‍රියාත්මක වී නොතිබුණි .

(ආ) වැඩි සීනි සංයුතියක් සහිත උක් ප්‍රභේදයන් උක් පර්යේෂණ ආයතනය විසින් හදුන්වා දී තිබුණත්, උක් දඩු මිලදී ගනු ලබන ආයතන විසින් උක් ගසේ අඩංගු සීනි සංයුතිය වෙනුවට එහි බර හා විශාලත්වය පදනම් කරගෙන මිලදී ගැනීම සිදුකර තිබීම නිසා ගොවීන් නව ප්‍රභේද වගා කිරීමට මැලිවී තිබුණි.ඒ හේතුව නිසා දැනට වගා කර ඇති බිම් ප්‍රමාණයෙන් ලබාගත හැකිව තිබුණු අස්වැන්න අඩු වීම නිසා දේශිය සීනි නිෂ්පාදනය අඩු වී තිබුණි.

4.3 **මතභේදයට තුඩු දෙන ගණුදෙණු**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

ඉංජිනේරු අංශය මගින් උක් වගාවට අදාල යන්ත්‍ර සූත්‍ර පිළිබඳ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම හා ඊට අදාල උපකරණ නිපදවීම සිදුකරනු ලබයි. ඊට අමතරව ආයතනයේ මෝටර් රථ වාහන නඩත්තු කිරීමද සිදුකරනු ලබයි. 2012 වර්ෂය තුල මෙම අංශය විසින් පර්යේෂණ ව්‍යාපෘති හා පර්යේෂණ සේවා ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ සම්බන්ධව සිදුකරනු ලද නියැදි පරීක්ෂාවේදී පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>උක් අස්වනු යන්ත්‍රයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (MT/01/11)</u>

උක් අස්වනු නෙලීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම හා උක් නෙලීමේ පිරිවැය අඩුකිරීමේ අරමුණ ඇතිව ඉකුත් වර්ෂවල සිට දේශීය වගා භූමි වලට ගැලපෙන ආකාරයට උක් අස්වනු නෙලීමේ යන්ත්‍රයක් නිපදවා අත්හදා බැලීම් සිදුකර තිබුණි. 2012 වර්ෂයේදී ද එම අවශ්‍යතාවය හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.440,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. නමුත් මෙම පර්යේෂණ ව්‍යාපෘතියට අදාළ කිසිදු කාර්යක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) <u>උක් රොඩු කපන යන්ත්‍රයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (MT/02/11)</u>

උක් දඩු නෙලීමේ දී පවතින දුර්වලතා මඟහරවා ගැනීමට සාර්ථක පිළියමක් වශයෙන් හා ශ්‍රම පිරිවැය අවම කර ගැනීමේ අරමුණින් ආයතනය විසින් ඉහල කාර්යක්ෂමතාවයකින් යුත් උක් රොඩු කැපීමේ යන්ත්‍රයක් හඳුන්වාදීමට සැලසුම් කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු.560,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘතියට අදාළ මූලික වැඩ සැලැස්මක් පමණක් නිර්මාණය කර තිබුණි.

(ඇ) <u>උක් බීජ වෙන් කිරීමේ උපකරණයක් නිර්මාණය කිරීම හා සැකසීම.</u>

මෙම ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.810,000 ක් වෙන් කර තිබුණද 2012 වර්ෂය තුල ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

## 4.4 <u>නිෂ්කාර්ය වත්කම් හා ඌණ උපයෝජිත වත්කම්</u>

අළුත්වැඩියා කර භාවිත කලහැකි ලෙසට නිර්දේශ කර තිබූ ශීතකරණ 06 ක් අළුත්වැඩියා කිරීමකින් තොරව වසර 3 ක කාලයක් ආයතනයේ ප්‍රධාන ගබඩාව තුල දිරාපත් වෙමින් පැවතුණි.

## 4.5 <u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අයවැයෙන් රු.66,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද භාණ්ඩාගාරයේ අනුමැතිය නොලැබීම නිසා සමාලෝචිත වර්ෂය තුල කිසිදු උපයෝජනයක් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | සළසා තිබුණු ප්‍රතිපාදනය |
|---|---|
| | රු. |
| විද්‍යාගාර සංකීර්ණයක් හා සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම -උඩවලව | 65,000,000 |
| කෘමීන් අධ්‍යනය කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,000,000 |
| එකතුව | 66,000,000 |

(ආ) උක් මල් මුහුන් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.2,000,000 ක අයවැය මගින් ප්‍රතිපාදන සළසා තිබුණද වර්ෂය අවසාන වන විටත් අදාල ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. මෙහි මුල් ගල තැබීමේ සමාරම්භක උලෙල සඳහා රු.179,505 ක් 2012 වර්ෂයේදි වැය කර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට වූ කාර්ය මණ්ඩලය පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 06 | 03 |
| තෘතියික මට්ටම | 25 | 19 | 06 |
| ද්විතියක මට්ටම | 52 | 36 | 16 |
| ප්‍රාථමික මට්ටම | 107 | 102 | 05 |
| | 193 | 163 | 30 |

(ආ) ආයතනයේ කළමනාකාර සහකාර පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කිරීම සඳහා පුවත් පත් දැන්වීම් පළකර වර්ෂ 02 ක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම තනතුරු වලට අදාල පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) කළමනාකාර සහකාර (ලිපිකරු/ගිණුම්), පොත් තබන්නා, ගිණුම් නිලධාරී යන තනතුරු පුරප්පාඩු වීම හේතුවෙන් ගිණුම් අංශයේ මුදල් ගනුදෙනු හා ගිණුම්කරණ කාර්යයන්ට අදාලව විධිමත් වැඩ පැවරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබීම හේතුවෙන් 2012 වර්ෂයේ පොත් තැබීම හා අවසන් ගිණුම් පිළියෙල කිරීම සඳහා රු.250,000 ක ගිවිසගත් මුදලකට බාහිර විගණන ආයතනයට පැවරීමට සිදුවී තිබුණි.

## 4.7 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ). ආයතනය සතු වාහන වල අලුත්වැඩියා කටයුතු ආයතනයේ යාන්ත්‍රික තාක්ෂණ අංශය මගින් මෙන්ම ආයතනයට පරිබාහිර වූ වෙනත් ආයතන මගින් ද ඉටුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ යාන්ත්‍රික තාක්ෂණ අංශය මගින් සිදුකර තිබූ වාහන අලුත්වැඩියාවන් 96 කට අදාලව වියදම් ඇස්තමේන්තුවක්, දැරූ පිරිවැය හඳුනාගැනීම සඳහා වූ පිරිවැය ගිණුම්කරන ක්‍රමවේදයක් නොතිබුණි.

(ආ). එක් එක් වාහනය සම්බන්ධයෙන් බාහිර ආයතන මගින් සිදුකල සමහර අළුත්වැඩියාවන්ට අදාල වටිනාකම් එම එක් එක් වාහන ලිපිගොණුවේ නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) සෙස් ආදායම
(ඇ) ස්ථාවර වත්කම්
(ඈ) ගබඩාකරණය.

එච්. ඒ. එස් . සමරවීර
විගණකාධිපති

# උක් පර්යේෂණ ආයතනය

கரும்பு ஆராய்ச் நிறுவனம்

SUGARCANE RESEARCH INSTITUTE


SRI/9/1

2013.04.20

සහකාර විගණකාධිපති
රජයේ විගණන අංශය,
පොල් වගා කිරීමේ මණ්ඩලය,
9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

විගණන අධිකාරී ඩී.එල්.ඩී. ගුණතිලක මහත්මියගේ අවධානයට

<u>උක් පර්යේෂණ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

උක්ත මැයෙන් ඔබ විසින් අප වෙත එවා ඇති යොමු අංක වයිඑස්/එෆ්/එස්ආර්අයි//එෆ්ජ්/2012 හා 2013 අප්‍රේල් 10 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ.

අප විසින් මීට පෙර විගණන වාර්තාවේ මෙහි සඳහන් කරුණු වලට අදාළව විගණන විමසුම් 01 සිට 09 දක්වා පිළිතුරු සපයා ඇත. එම නිවැරදි කිරීම් මෙම වාර්තාවෙහි නිවැරදි කර නොමැති බව දැනුම් දෙන අතර, එම නිවැරදි කිරීම් සිදු කිරීමෙන් අනතුරුව අවසන් වාර්තාව 14 (2) ( C) සංශෝධනය කොට ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

එම 14 (2) (සී) වාර්තාවට අනුව අපගේ පිළිතුරු පහතින් දක්වා ඇත.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

එකගවෙමි.

1.3 <u>විගණකගේ වගකීම</u>

එකගවෙමි

2. මූල්‍ය ප්‍රකාශන

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 <u>ගිණුම් කරන ප්‍රතිපත්ති</u>

අප ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය සෙස් බදු ආදායම් වේ.ආනයනික සීනි මත හා දේශිය සීනි නිෂ්පාදනය මත සෙස් බදු අදායම අපට හිමි වේ. ආනයනික සීනි මත මුදල් පදනම මත සෙස් බදු ආදායම ගිණුම් ගත කරන අතර, දේශිය නිෂ්පාදනය මත සෙස් බදු අදායම ගිණුම් ගත කිරීම මුදල් පදනම මත සිදු කල නොහැක.2012 වර්ෂයේ දේශිය සීනි නිෂ්පාදන කර්මාන්ත ශාලා වල නිෂ්පාදිත සීනි ප්‍රමාණය අනුව සෙස් බදු


සභාපති / தலைவர் / Chairman: 011-2607161, 011-2605145 (Fax)
අධ්‍යක්ෂක / பணிப்பாளர் / Director: 011-3096173, 047-2233282
කාර්යාලය / அலாவலகம் / Office: දුරකථන/தொலைபேசி/Telephone 047-2233281/ 2233285; ෆැක්ස් /தொலைநகல்/Fax 047-2233233; E-mail: edirector@yahoo.com

කොළඹ කාර්යාලය / கொழும்பு அலாவலகம / Colombo Office
තෙලවල පාර, රත්මලාන / தெலலல இத்மலானை / Thelawala Rd, Ratmalana.
කාර්යාලය / அலுவலகம் / Office: 011-2605759
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2605236

ගෙවන ලෙසට දේශීය සිනි නිෂ්පාදිත ආයතන වලට දැනුම් දී ඇත. ඒ අනුව 2012 වර්ෂය සඳහා ලැබිය යුතු සිනි නිෂ්පාදනය මත ලැබිය යුතු සෙස් බද්ද රු. 5,057,250/- වේ. මෙය ලැබිය යුතු සෙස් ආදායම ලෙස ගිණුම් ගත කර ඇත.

2.2 <u>ගිණුම් කරණ අඩුපාඩු</u>

අ. එකගවෙමි. නිවැරදි කිරීමට උපදෙස් දී ඇත.

ආ. 2012 වර්ෂයේදී රු. 6,500,000/- ක් වටිනා කැබ් රථ 02 කක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිම කර ඇත. 2012 අයවැය ඇස්තමේන්තුව මගින් මේ සඳහා මුදල් වෙන් කර තිබුණි. මෙම කැබ් රථ 02 ක 2012 දෙසැම්බර් මස අප වෙත වෙන් කර තිබූ අතර, එක් වාහනයක තිබූ අඩුපාඩු නිසා ආයතනය වෙත ලැබීම පමාවිය. එබැවින් 2012 වර්ෂය තුළ ගිණුම් වල ඇතුලත් කර ඇත.

2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

2.3.1 <u>ලැබිය යුතු ගිණුම්</u>

අ. නිවැරදි වේ.

ආ. රු. 195,968/- ක මුදල ඉක්මණින් අය කර ගැනීමට උපදෙස් දුන් අතර, රු. 1,759,644/- ණය ගැති ශේෂය එවකට අපගේ අමාත්‍යාංශය වූ අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ උපදෙස් අනුව ඌව ප්‍රදේශයේ උක් ගොවි ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට එම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දී තිබූ ණය මුදලක් වේ. එම අමාත්‍යාංශය අහෝසි වී ඇති බැවින් 2012 පාර්ලිමේන්තු පොදු කාරක සභාවේදී භාන්ඩාගාර අනුමැතිය ලබා පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලැබුණි. රු. 5,100/- ක මුදලද අයකර ගැනීමට උපදෙස් දී ඇත. 2013 වර්ෂයේදී අදාල නිවැරදි කිරීම් සිදු කරනු ඇත.

2.3.2. <u>ගෙවිය යුතු ගිණුම්</u>

<u>ණය හිමි කාල විශ්ලේෂණය</u>

ගෙවිය යුතු ගිණුම් 2013 වසරේදි පියවීමට උපදෙස් ලබා දී ඇත.

2.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

ශේෂ සනාථ කිරීමේ ලිපි යවා ඇත.

2.4 කළමණාකරන අකාර්යක්ෂමතා

(අ.) <u>ආනයනික සිනි මත සෙස් බදු අය කිරීමේ ක්‍රියාවලිය</u>

i).. 2012 වර්ෂයේදි සෙස් සහතික නිකුත් කිරීමකින් තොරව ආනයනය කර තිබූ සිනි කි.ග්‍රෑම්. 140,600 ක් සඳහා අදාල සෙස් බද්ද අදාල සමාගමෙන් සම්පූර්ණයෙන්ම අයකර ගෙන ඇත.

ii) රේගු දෙපාර්තමේන්තුව සමග බැඳුම්කරයකට යටත්ව සීනි ආනයන කරන ව්‍යාපාරිකයන්ගෙන් ගුදම් වල තැන්පත් කර ඇති හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුවෙන් අදාල වාර්තා ලබා ගැනීමට විශේෂ වැඩ පිළිවෙලක් දියත් කිරීමට කටයුතු කර ඇත.

ආ. <u>කාර්යමණ්ඩල බඳවා ගැනීම්</u>

i) 2013 අප්‍රේල් මස සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබා දීමට කටයුතු සලසා ඇත.

ii) පොත් තබන්නා සහ ගිණුම් නිලධාරි තනතුරු සඳහා දැනටමත් බඳවාගෙන රාජකාරියෙහි නියැලී ඇත.

iii) එකගවෙමි.

ඇ. <u>නඩත්තු ඒකකය</u>

i) නඩත්තු ඒකකයේ වැඩ කටයුතු විධිමත් පරිදි පවත්වාගෙන යාම සඳහා එම ඒකකය භාරව කටයුතු කිරීම සඳහා වැඩ අධිකාරිවරයෙකුගේ අවශ්‍යතාවය ආයතනය විසින් මෙන්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ද පිළිගෙන ඇත. මේ අනුව අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව මෙම තනතුර සඳහා සුදුස්සකු තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් මගින් 2012 වර්ෂය තුළ අවස්ථා දෙකකදී අයදුම්පත් කැඳවන ලද නමුත් සුදුස්සකු ඉදිරිපත් නොවිය. එබැවින් වැඩ බලන පදනම මත වැඩ අධිකාරිවරයෙකු පත් කර ඇත.

ii) කාර්ය මණ්ඩලයේ පවත්නා ඉහත සඳහන් පුරප්පාඩුව පිරවීමට නොහැකිවීම මත නඩත්තු ඒකකය මගින් ඉටු කරනු ලබන කාර්යයන් සඳහා විධිමත් අයුරින් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව නොතිබුණි.

iii) පිරිවැය ලිපිකරුවෙකු 2012 වර්ෂය තුළ සේවයට යොදවා ගැනීමට නොහැකි වූ බැවින් එක් එක් අයිතමය සඳහා වැයවූ පිරිවැය ගණනය කිරීමේ අපහසුතාවය පැන නැගී ඇත. කළමනාකරණ සහකරුවන් බඳවා ගැනීමෙන් පසු මෙම තත්වය වෙනස් කිරීමට අපේක්ෂා කෙරේ.

iv) සේවක ඌනතාවය සහ සම්පත් හිගකම නිසා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වි ඇත.

ඈ. <u>වාහන අලුත්වැඩියාව</u>

i) එකගවෙමි. සේවක හිගය මෙයට බලපා ඇත. 2013 වර්ෂයේදි කළමනාකරණ සහකාරවරුන් බඳවා ගත් පසු ක්‍රම වේදයක් සකස් කිරීමට පියවර ගනු ඇත.

ii) යාවත් කාලීන කිරීමට උපදෙස් දී ඇත.

ඉ. **ගබඩා අංශය**

ආයතනයේ ප්‍රධාන ගබඩාවේ අයිතම 7000 ක් පමණ විවිධ අංශවලට නිකුත් කර අතර මේ සඳහා විධිමත් ලේඛණ ක්‍රමයත් පවත්වාගෙන යයි. එහෙත් සම්මත බින්කාඩ් ක්‍රමයක් ක්‍රියාත්මක නොවේ. අවශ්‍ය පහසුකම් නොමැතිවීම ඊට හේතුවී ඇති අතර, මෙතෙක් බින්කාඩ් ක්‍රමය ක්‍රියාත්මක වී නැත. ඉදිරියේදී පහසුකම් සපයා ගෙන මෙම බින්කාඩ් ක්‍රමය කඩිනමින් හෝ ඊට සමාන පරිඝණක මෘදුකාංග ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

(ඊ) **ස්ථාවර වත්කම් ලේඛණය**

i) ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛණය 2011 දී යාවත්කාලීන කළ අතර, එය යාවත්කාලීන කරන්නේ වාර්ෂික පදනම මත වේ. ඒ අනුව මේ වන විට 2012 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛණය යාවත් කාලීන කර ඇත. මෙහි පිටපතක් රජයේ විගණන අංශයටද භාර දී ඇත.

ii) අවසන් වරට යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛණයේ අඩුපාඩු ඇති බව පිළිගනිමි. ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛණය නිවැරදිව යාවත් කාලීන කිරීමට පියවර ගැනීමට තීරණය කර ඇත.

iii) ආයතනයේ ගබඩාව වෙත ලැබෙන ස්ථාවර වත්කම් සංකේතකරණයකින් තොරව නිකුත් කිරීම.

ස්ථාවර වත්කම් ගබඩාවට ලැබුන පසු සංකේතකරණයක් ලබා දී නිකුත් කිරීම ක්‍රියාත්මක කිරීමට දැනටමත් පියවර ගෙන ඇත.

2.5 **හඳුනාගත් පාඩු**

ආයතනය සතුව වාහන 23 ක් තිබෙන නමුත් මෙම වාහන වලින් 19 ක් අවුරුදු 15 කට වඩා පැරණි ඒවා වේ. බස් රථයක්, කෲ කැබ් රථයක් සහ කැබ් රථ දෙකක් පමණක් හොඳ ධාවන තත්වයේ පවතී. අනෙකුත් වාහන නිතරම දෝෂ සහිතව ධාවනයෙන් ඉවත් කිරීමට සිදුවේ.

ධාවන තත්වයේ පවතින කැබ් රථ දෙකෙන් එකක් අධ්‍යක්ෂතුමාගේ නිල රථය ලෙස වෙන් කර ඇත. අප ආයතනය විසින් කිලිනොච්චිය, කන්තලේ, හිගුරාන, අම්පාර ආදී ප්‍රදේශවල උක් වගා කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. මෙම ස්ථානයන් කරා පර්යේෂණ නිලධාරීන්, කම්කරුවන් සහ අනෙකුත් නිලධාරීන් ප්‍රවාහනය කිරීමේදී හොඳ තත්වයේ වාහන නොමැති කමින් කුලී පදනම මත වාහන ලබා ගැනීමට සිදුවී ඇත. රජයේ විගණන අංශය විසින් එවා ඇති විගණන විමසුමට අනුව දක්වා ඇති ධාවන සටහන් මෙකී කාර්යයන් සඳහා යොදා ගත් වාහන සඳහා අදාල වේ. ඒ අනුව සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහතුන් සහ අමාත්‍යාංශයේ නිලධාරීන් කොළඹ සිට කන්තලේ, හන්තාන, හිගුරාණ ආදී ප්‍රදේශ සඳහා රැගෙන යාමට සහ ඒමට වාහන කුලියට ලබාගෙන ඇත.

මේ සම්බන්ධයෙන් විගණන විමසුමට අදාල තොරතුරු 2013.04.04 දින විගණන අංශය වෙත යොමු කර ඇත.

0.3 **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මූල්‍ය සමාලෝචනය**

එකගවෙමි.

3.2 **මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

(අ.) උක් පර්යේෂණ ආයතන පනතේ ප්‍රකාර සුදුසුකම් තොලැබූ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු පත්කර තිබූ අතර, එම පත්වීම් සියල්ලම මේ වනවිට අහෝසි කොට ඇත. උක් පර්යේෂණ පනතේ ප්‍රකාර සුදුසුකම් ලබන විද්‍යාඥයින්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇත.

(ආ) සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් හා උක් පර්යේෂණ ආයතනයේ නිලධාරීන් විසින් කන්තලේ ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකා වල යෙදමින් උක් ප්‍රභේද ගුණනය කිරීමේ වැඩ සටහනට සහභාගිවීම මෙන්ම අමාත්‍යාංශයේ නිලධාරීන් හා උක් පර්යේෂණ ආයතනයේ නිලධාරීන් කුකුලේ ගග පැවති වැඩ මුළුවකට සහභාගි වීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම හා කන්තලේ ප්‍රදේශයේ ආරම්භ කරන ලද උක් ප්‍රභේද වැඩි දියුණු කිරීමේ වැඩ සටහනේ පසු විපරම් රාජකාරි හා ගොවීන්ට පැන නැගී ඇති ගැටළු සාකච්ඡා කිරීමට උක් පර්යේෂණ ආයතනයේ නිලධාරීන් හා සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගි වීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම මෙන්ම අළුතින් ආරම්භ කරන ලද සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය සඳහා වාහන හිගයක් පැවති බැවින් අමාත්‍යාංශ ලේකම්තුමාගේ ඉල්ලීම මත ඉහත අංක සඳහන් වාහන වරින් වර අමාතයාංශයේ රාජකාරි සඳහා උක් පර්යේෂණ ආයතනය විසින් ලබාදීම සිදුකර ඇත. ඉන්ධන සපයා ගැනීම අමාත්‍යාංශය විසින් සිදුකර ඇති අතර, ධාවන සටහන් පොත්වල ධාවනය කරන ලෙස ස්ථාන හා දුර ප්‍රමාණයන් සටහන් කර ඇත.

3.3 **ආයතනයට එරෙහිව ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

එකගවෙමි.

3.4 **නිෂ්කාර්ය වත්කම් හා ඌණ උපයෝජිත වත්කම්**

වෙන්දේසි කර විකිනීම සඳහා නම්කර තිබූ ශිතකරණ 06 ක් තොග පරීක්ෂණ කමිටුව මගින් අළුත්වැඩියා කිරීමට නිර්දේශ කර තිබුණි. මේ ශිතකරණ 6 අළුත්වැඩියා කිරීමට මිළ ගණන් කැඳවූ අතර, ඒ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බව පෙනුණි. මෙම වියදම් වන මුදලින් අළුතින් ශිතකරණ කිහිපයක් මිළදී ගැනීම වඩා ඵලදායි බව පෙනී ගිය බැවින් අළුතින් ශිතකරණ මිළදී ගත් අතර, මෙම ශිතරණ වෙන්දේසියේ විකිනීමට තීරණය කරන ලදි. ඉදිරියේදී වෙන්දේසියේ විකිනීම සිදු කිරීමට නියමිතය.

3.5 **උක් දඬු මිළදී ගැනීමේ ක්‍රම වේදය**

(අ) පැලවත්ත, සෙවනගල හා හිගුරාණ සීනි සමාගමේ ගොවීන්ගෙන් උක් අස්වැන්න මිලදී ගැනීමේදී උක් දඬුවල බර පමණක් සැලකිල්ලට ගනු ලැබේ. කර්මාන්ත ශාලාව වෙත සපයනු ලබන උක් ගස්වල ඇති සීනි සංයුතිය, ඒවා කර්මාන්ත ශාලාව වෙත ලබා ගන්නා අවස්ථාවේදී මිනිම කරනු නොලැබේ. එම අවස්ථාවේදී සීනි සංයුතිය මිනීමට නම් කෝසාම්ප්ලර් නැමති උපකරණය මගින් කර්මාන්ත ශාලාව වෙත ගෙනෙන සෑම උක් දඬු තොගයකින්ම සාම්පල ලබාගෙන පසුව විද්‍යාගාරයේදී සීනි සංයුතිය මිනීමෙන් කරනු ලබන්නෙකි. මෙම ක්‍රියාවලිය ඇමෙරිකාව, ජපානය, ඕස්ට්‍රේලියාව වැනි දියුණු රටවල කරනු ලබන අතර, උක් ගස්වල බර සහ සීනි සංයුතිය සලකා සෑම උක් දඬු තොගයන් වෙනුවෙන් මිල තීරණය කරනු ලැබේ. නමුත් ශ්‍රී ලංකාව, පකිස්ථානය ඉන්දියාව වැනි බොහෝ දියුණු වෙමින් පවතින රටවල සීනි කර්මාන්ත ශාලාවන්හි මෙම ක්‍රියවලිය කරනු නොලබන්නේ මේ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවිනි. නමුත් ශ්‍රී ලංකාවේ, උක් ගොවිබිම් වලින් උක් ගස් කර්මාන්ත ශාලාව වෙත සැපයීමේදී , උක් ගස් නියමිත මේරීමට ලක්ව් තිබේදැයි පළමුව පරීක්ෂාකර, එහි නියමිත මේරීම් ඇත්නම් පමණක් අස්වනු නෙලිම නිර්දේශ කරනු ලැබේ. එවැනි උක් තොගවල සීනි සංයුතිය ඉහළ මට්ටමක පවතී. එවැනි උක් තොගවල බර සලකා උක් තොග සඳහා ගෙවීම් කරනු ලැබේ.

(ආ) සීනි නිෂ්පාදන ආයතන මගින් උක් ගස් වල බර ප්‍රමාණය අනුව උක් ගස් මිලදී ගැනීම සිදු කරනු ලබන බැවින් අප ආයතනයේ නිෂ්පාදිත නව උක් ප්‍රභේද වල සීනි සංයුතිය ඉහළ මට්ටමක තිබුනද ගොවීන් වැඩි බර පැරණි උක් වර්ග වලට යොමුව් ඇත. සීනි කර්මාන්ත සංවර්ධන අමාතයාංශය වෙත මේ සම්බන්ධව කටයුතු කිරීම සඳහා දැනුම් දි ඇත.

(ඇ) දැනට සීනි කර්මාන්ත ආයතන රජය සතු ආයතන වන බැවින්, සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය හරහා අපගේ ඉහළ සීනි සංයුතියකින් යුත් උක් ප්‍රභේද ගොවීන් අතර ප්‍රචලිත කිරීමට අවශ්‍ය කටයුතු සැළසුම් කර ඇත.

(ඈ) වැඩි ඵලදාවක් සහිත උක් ප්‍රභේද ගොවීන් ජනප්‍රිය කිරීමට සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ අනුග්‍රහය ලබා ගැනීමට සැළසුම් කර ඇත.

මෙම කරුණු සම්බන්ධයෙන් විගණන විමසුම් වයිඑස්/ එෆ් / එස්ආර්අයි / ජිකිව් /2012 /09 සම්බන්ධයෙන් 2013.03.06 දින පිළිතුරු සපයා ඇත. ඊට අදාල පිළිතුරු මේ සමග අමුණා ඇත.

## 3.6 කාර්යසාධනය

### අ ) ඉංජිනේරු අංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

### i) උක් අස්වනු යන්ත්‍රයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය ( MT/01/11)

උක් අස්වනු නෙලීමේ යන්ත්‍රයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට සැලසුම් කර තිබුනේ සුළු පරිමාණ උක් නෙලීමේ යන්ත්‍ර නිෂ්පාදනය කරන ආයතනවෙත ගොස් ඒවා අධ්‍යයනය කිරීමයි. ඉන් අවශ්‍ය තොරතුරු රැස්කර ආයතන කිහිපයකට අවශ්‍ය ලිපි ගනුදෙනු විද්‍යුත් තැපැල් මගින් සිදු කළත් ඒවාට

සුදුසු ප්‍රතිචාරයක් නොලැබුනු බැවින් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි වී ඇත.

ii) **උක් රොඩු කපන යන්ත්‍රයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය ( MT/02/11)**

මෙම අංශයේ සේවය කිරීමට අවශ්‍ය පර්යේෂණ නිලධාරීන්ගේ හිඟතාවය හේතුවෙන් බෙහෝ වැඩ කටයුතු සිදු කිරීමට ප්‍රමාද විය. එමනිසා පර්යේෂණ කටයුතු අඩපණවූ අතර, මේ වන විට අළුතින් පර්යේෂණ නිලධාරීවරයෙකු බඳවා ගෙන ඇති බැවින් ඔහු දැනට මෙම පර්යේෂණ ආරම්භ කර ඇත.

iii) **උක් බීජ වෙන් කිරීමේ උපකරණයක් නිර්මාණය කිරීම හා සැකසීම**

පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමේ ප්‍රමාදය මත මෙම කාර්යය ආරම්භ කිරීමටද අපොහොසත් විය. මේ වන විට නිලධාරීවරයෙකු අළුතින් බඳවා ගෙන ඇති බැවින් මෙම අතපසුවූ කාර්යයන් කරගෙන යමින් සිටී.

iv) **ටයින් කල්ටිවේටර් නිපදවීමේ ව්‍යාපෘතිය ( MT/RS/01/12)**

2011 වසරට සැළසුම් කළ ටයින් කල්ටිවේටර් 20, නිපදවන ලද අතර, ඉන් 09 ක් ගොවීන් හට ලබාදෙන ලදී. ඉතිරි 11 ගොවීන්හට ලබාදී අවසන් කරන තුරු නැවතත් නිෂ්පාදනය කිරීම තාවකාලිකව නවතන ලදී.

(ආ) 2012 වසරේදී මෙම කටයුත්ත සඳහා මුදල් වෙන්කර තිබුනද මිලදී ගැනීම් සිදු නොවූ හෙයින් එය 2013 වර්ෂයේදී අයවැයෙන් මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

3.7 **අතහැර දමා තිබූ ව්‍යාපෘති**

විද්‍යාගාර සංකීර්ණයක් හා සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා මිලියන 65 ක් 2012 අයවැය ලේඛණයෙන් වෙන් කර තිබුනද භාණ්ඩාගාරයේ අනුමැතිය මෙතෙක් අප වෙත ලැබී නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

කෘමීන් අධ්‍යයනය කිරීමේ මධ්‍යස්ථානයක් ඇති කිරීම සඳහා මිලියන 1 ක් 2012 අයවැය ලේඛණයෙන් වෙන් කර තිබුනද භාණ්ඩාගාරයේ අනුමැතිය මේ සඳහා ලැබී නොමැති බැවින් අප ආයතනය සතු පැරණි ගොඩනැගිල්ලක් ඒ සඳහා යොදවා ඇත.

(ආ) දෙනියාය උප පර්යේෂණ මධ්‍යස්ථානයේ උක් මල් මුහුන් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා 2012 වර්ෂයේ මිලියන දෙකක් වෙන් කර ඇති අතර, සමාලෝචිත වර්ෂය තුලදී එහි සමාරම්භක වියදම් සඳහා රු. 179,505/- ක මුදලක් වැය කර තිබුනි. එම භූමියේ තිබූ කළු ගල් කඩා ඉවත් කිරීම සහ යෝජිත ගොඩනැගිල්ලට අවශ්‍ය කළු ගල් කැඩීම දැනටමත් අවසන් කර ඇත. රු.

750,000/- ගෙවා ඇත. 2013 වර්ෂයේදි එහි කටයුතු තවදුරටත් කරගෙන යාමට කටයුතු සැළසුම් කර ඇත.

04. **<u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>**

2013 වර්ෂයේදි මෙම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

05. **<u>පද්ධති හා පාලන</u>**

**ගිණුම් කරණය - ලෙජරයට පිටපත් කිරීමේ දෝෂ පැවතිම**

නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදි.

**සෙස් අදායම - සැසදුම් වාර්තා පවත්වාගෙන නොතිබුණි.**

සැසදුම් වාර්තා සකස් කර අවසන් කර ඇත.

**ස්ථාවර වත්කම් ලේඛණය - ක්‍රමවත්ව පවත්වාගෙන නොතිබුණි.**

2013 වර්ෂයේදි මෙය ක්‍රමවත් කිරීමට උපදෙස් දෙන ලදි.

**ගබඩාකරණය - වාර්තා නිසි පරිදි පවත්වාගෙන නොතිබුණි**

වාර්තා නිසි පරිදි පවත්වා ගෙන යාමට උපදෙස් දෙන ලදි.

එස්.කේ. සිරිල්
සභාපති

පිටපත - ලේකම්, සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

# වර්ෂ 2008 සිට 2012 දක්වා ප්‍රධාන මූල්‍ය තොරතුරු

ආදායම

| අයිතම | රු.මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| සීනි ආනායනය මත සෙස් බදු | 134.8 | 129.85 | 142.88 | 144.12 | 139.32 |
| පොලී හා වෙනත් ආදායම් | 35.52 | 28.14 | 20.48 | 17 | 24.04 |
| උක් විකිණීම | 24.04 | 24.04 | 0 | 0.9 | 1.65 |
| එකතුව | 172.33 | 158.77 | 163.36 | 162.02 | 165.01 |

වියදම්

| අයිතම | රු.මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| පුනරාවර්තන වියදම් | | | | | |
| කාර්ය මණ්ඩලයට ගෙවීම් | 73.23 | 78.19 | 78.78 | 81.67 | 92.1 |
| ගමන් වියදම් හා යැපීම් වියදම් | 1.49 | 1.57 | 1.7 | 1.75 | 2.63 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 4.37 | 7.81 | 5.62 | 5.91 | 9.88 |
| සැපයුම් හා පාරිභෝගික භාවිතයන් | 3.61 | 1.3 | 1.83 | 1.17 | 1.52 |
| ගිවිසුම්ගත සේවා | 18.9 | 17.43 | 17.8 | 21.57 | 20.97 |
| නඩත්තු | 11.4 | 14.11 | 12.14 | 13.22 | 17.11 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 1.78 | 2.32 | 1.19 | 2.03 | 27.21 |
| මූල්‍ය පිරිවැය | 0.17 | 0.19 | 0.15 | 0.14 | 0.03 |
| එකතුව | 114.95 | 122.92 | 119.21 | 127.46 | 171.45 |
| | | | | | |
| ප්‍රාග්ධන වියදම් | | | | | |
| ගොඩනැගිලි | 2.12 | 0 | 8.82 | 0.36 | 0.12 |
| කාර්යාල /රසායනාගාර /ක්ෂේත්‍ර | 10.38 | 2.68 | 3.78 | 2.32 | 3.21 |
| වාහන | 0 | 1.09 | 13.22 | 0 | 6.5 |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන | 0.03 | 0.13 | 0.68 | 1.2 | 0 |
| පුස්තකාල පොත් | 0 | 0 | 0 | 0.05 | 0 |
| ලී බඩු හා සවි කිරීම් | 0.35 | 0.36 | 0.69 | 0.48 | 0.72 |
| වෙනත් පහසුකම් | 0.14 | 0.03 | 0.02 | 0.08 | 0.05 |
| එකතුව | 13.02 | 4.29 | 27.21 | 4.49 | 10.6 |
| මුළු එකතුව | 127.97 | 127.21 | 146.42 | 131.95 | 182.05 |